# 2026.01.06 දින පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගිවූ ගරු මන්ත්‍රීවරුන්

1. ප්‍රාදේශීය සභා ගරු සභාපති යහලවෙල ගෙදර සංජීව කරුනාසාගර මහතා
2. ප්‍රාදේශීය සභා ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැණිකාමාර දූරයලාගේ මනෝ කුමාර එදිරිසිංහ මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අලහකෝන් පතිරන්නැලාගේ තරංග චම්පික අලහකෝන් මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි දෙලංකාගේ නිමාලි දිල්හානි මෙනෙවිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කඩුකාර මුදියන්සේලාගේ නන්දසිරි මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ චාමින්ද දසනායක මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහමායාගොඩගේ විරාජ් මලින්ද ඩයස් මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් සුජීව හේරත් මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉදිරිප්පුලිගේ සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි මුතුගල නිශාන්ති ගුණතිලක මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අගාරේ ගෙදර දූරයාලගේ රංජිත් ප්‍රේමලාල් මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්පටිදේවගේ ලාලිත ඉඳුනිල් මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුරුප්පු මුදියන්සේලාගේ අජිත් තිලකසිරි මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේන්ද්‍ර ගල්අද්දලාගේ අජිත් ලක්ෂ්මන් මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අකුරන් පේඩි දූරයලාගේ ඉෂාන් මධුශංක පීරිස් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසේ හේවගේ මාලක අරුණ කුමාර මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එදිරිසිංහ ආරච්චිලාගේ ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රහ්මචාරිගේ සුදත් උදය කුමාර මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මුදියන්සේලාගේ දිලිප් ජයසිංහ මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නායක මුදියන්සේලාගේ උපුල් නිශාන්ත මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විස්කම් නන්දන වඩු ආචාරිගේ රංජිත් නවරත්න මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා අශෝක හේරත් මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රාධිපතියලාගේ රංජිත් අබේපාල මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහමඩ් තස්ලිම් මහතා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රාජගුරු දිසානායක මුදියන්සේලාගේ ජයන්ත දිසානායක මහතා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වීරරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකරුණානායක මුදියන්සේලාගේ නිලන්ති විජේසිංහ මහත්මිය
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහමඩ් කබීර් රිෆාක් හුසේයින් මහතා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොලවත්තගේ දොන් සිරන්ත පද්මලාල් මහතා

**රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්හොටි හලුවන්නැහැලාගේ රංජිත් උපාලි මහතා

**<u>ආගම සිහි කිරීම.</u>**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය කිරීමෙන් , ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූල ආරම්භ කරන ලදී. 2026 ජනවාරි මස මහා සභා රැස්වීමට සහභාගි වන ගරු උපසභාපති ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය ,ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියළුදෙනාට ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියළුදෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

**<u>06 (අ). 1.පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සහ පසුගිය විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම .</u>**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

2025.12.09 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව යෝජනා සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ගරු උප සභාපතිතුමා විසින් ගෙන එන ආ ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදිනට පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

2025.12.18 වන දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව යෝජනා සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පසුගිය විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ගරු උප සභාපතිතුමා විසින් ගෙන එන ආ ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පසුගිය විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදිනට පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

පලාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් නිකසල පුරවරයක්-සුවබර දිවියක් ඩෙංගු මර්ධන වැඩසටහන 2026.01.07 සිට 2026.01.09 දක්වා පළාත් පාලන ආයතන තුල ක්‍රියාත්මක කරන්න කියලා චක්‍රලේඛයක්

නිකුත් කරලා තියෙනවා. ඒකට අනුව අපි විශේෂයෙන්ම ශ්‍රමදාන දින 2 ක් යොදාගෙන තියනවා. ජනවාරි 08 වෙනිදා බණ්ඩාරකොස්වත්ත නගරයත්, ජනවාරි 09 කොටොම්පිටිය නගරයත් ලෙස.කොටොම්පිටිය නගරයේ විශේෂයෙන් කාණු පද්ධතියේ තියෙන ප්‍රශ්න ටික, බණ්ඩාරකොස්වත්ත නගරයේ කාණු පද්ධතියේ තියෙන ප්‍රශ්නත් එක්කම ශ්‍රමදාන කටයුත්තක් මේකට සූදානම් කරගන්න ඕන.ඒ නිසා සියළුම මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා මේ ශ්‍රමදාන වැඩසටහන සඳහා සම්බන්ධ වෙන්න කියලා ඉල්ලීමක් කරනවා.
ඊළඟට පහුගිය දියීවා සුළි කුනාටුව නිසා ආපදාවන්ට පත්වෙච්ච මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේදී අපිට විශාල දායකත්වයක් ප්‍රදේශවල ජනතාව ලබා දුන්නා.විශේෂයෙන්ම වෙහෙර විහාරවල ස්වාමීන් වහන්සේලා,ඒ වගේම මස්ජිද්වල මවුලවීතුමාලා, ඒ වගේම කතෝලික පූජකතුමන්ලා ඇතුළු ස්වෙච්ඡා සංවිධානවල විශාල පිරිසක් අපිට සහයෝගය දුන්නා මේ කටයුත්ත ස්වෙච්ඡාවෙන්, සාර්ථකව අඩු වියදමකින් නිම කරගන්න .ඒ අයට අපේ ස්තූතිය පුද කරනවා.

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.

## 1.නිවාඩු අනුමත කිරීම.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

අපේ රංජිත් උපාලි මන්ත්‍රීතුමා නිවාඩු ඉල්ලලා තියෙනවා.. එම නිවාඩු අනුමත කරදෙන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)</u>**

ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මන්ත්‍රීතුමාට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරුමන්ත්‍රී ආර්.එච් රංජිත් උපාලි මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**II.2025.12.16** වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

2025.12.16 වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රිනී අයි සද්නා දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ආර්.එච්.රංජිත් උපාලි මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා- (ජා.ජ.බ)</u>**

2025.12.16 වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රිනී අයි සද්නා දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ආර්.එච්.රංජිත් උපාලි මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා- (ජා.ජ.බ)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2025.12.16 වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී ගරු මන්ත්‍රිනී අයි සද්නා දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ආර්.එච්.රංජිත් උපාලි මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**III.2025.12.22 වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

2025.12.22 වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රිනී අයි සද්නා දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රිනි එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය,ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරිස් මහතා, ගරු මන්ත්‍රි එම් .ටී.එම්.තස්ලිම් මහතා,ගරු මන්ත්‍රිනී බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා- (ජා.ජ.බ)</u>

2025.12.22 වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රිනී අයි සද්නා දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රිනි එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය,ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරිස් මහතා, ගරු මන්ත්‍රි එම් .ටී.එම්.තස්ලිම් මහතා,ගරු මන්ත්‍රිනී බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා- (ජා.ජ.බ)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2025.12.22 වන දින මුදල් හා ප්‍රතිපත්ති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රිනී අයි සද්නා දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රිනි එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය,ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරිස් මහතා, ගරු මන්ත්‍රි එම් .ටී.එම්.තස්ලිම් මහතා,ගරු මන්ත්‍රිනී බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

සභාව වෙත සංදේශ කීපයක් ලැබී තියෙනවා.

මෙය ඉදිරිපත් කරලා තියෙන්නෙ සභාපති,තිස්සව ප්‍රජා මන්ඩලය, තිස්සව, කොස්දෙණිය , සභාපති, ප්‍රාදේශීය සභාව, පඩුවස්නුවර,සභාපතිතුමනි,ස්තුතිය ප්‍රකාශ කිරීම, 20/12/2025 දින අප විසින් සියඹලාවැව මං සන්ධියේ සිට තිස්සව රජමහා විහාරය දෙසට දිවෙන මාර්ගයේ බොරළු අතුරා දෙන ලෙස කරන ලද ඉල්ලීම් ලිපියට ප්‍රතිචාර දක්වමින්, එම මාර්ගයේත් ගල් කඩුල්ල මාර්ගයේත් ප්‍රදේශවාසින්ගේ සහයෝගයද ඇතිව මනා ලෙස බොරළු ඇතිරීම පිලිබඳව ඔබතුමාටත් ප්‍රාදේශීය සභාවේ සියළු කාර්ය මන්ඩලයටත්, ප්‍රදේශවාසින්ගේ ප්‍රශංසනීය ස්තුතිය මෙසේ ප්‍රකාශ කර සිටිමු. මෙයට සභාපති.

ගැමුණු එක්සත් ගොවි සංවිධානය, දිවුල්කඩවර, කොස්දෙණිය, සභාපති, ප්‍රාදේශීය සභාව, පඩුවස්නුවර, ස්තුතිය පල කිරීම,ගරු සභාපතිතුමනි,අප පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් 1375 කන්දෙ මැදගම පලාතේ දිවුල්කඩවර ග්‍රාමයේ පිහිටි මැදගම හන්දියේ සිට කනෝගම දක්වා වූ මාර්ගයේ මැදගම අනුක්කන්පිටියේ සිට දිවුල්කඩවර සුසාන භූමිය දක්වා වූ මාර්ගයටත් දිවුල්කඩවර හන්දියේ සිට කොස්දෙණිය ඉලුප්පිටිය දක්වා වූ මාර්ගයේ එච්.එම්.පුංචිඅප්පුහාමි මහතාගේ නිවස අසල සිට දිවුල්කඩවර හන්දිය දක්වා වූ මාර්ගයටත් බොරළු දැමීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කරදී එම කාර්යය ඉතාමත් සුදුසු අන්දමින් නිමකර දීම පිලිබඳව අප දිවුල්කඩවර ගම්වාසින්ගේ ස්තුතිය හා ප්‍රණාමය ඔබතුමාට පුද කරන්නෙමු.අත්සන් ලේඛණයක් සහිතව තියනවා.

ඊටපස්සෙ එක්සත් අවමංගල්‍යාධාර සමිතිය, මිදියාල,බණ්ඩාරකොස්වත්ත, සභාපති, ප්‍රාදේශීය සභාව, පඩුවස්නුවර . දියීවා සුලි කුණාටුව නිසා අබලන් වූ මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව ස්තුතිය පල කිරීමේ මහජන සංදේශය. ගරු සභාපතිතුමනි, බණ්ඩාරකොස්වත්ත නගරයට ප්‍රවිෂ්ඨ වන මිදියාල වෙලමැද කිලෝමීටර් භාගයක් පමන වන අබලන්ව තිබූ මාර්ගය දියීවා සුළි කුනාටුව නිසා සම්පූර්ණයෙන් විනාශයට පත්විය. මෙම මාර්ගය ගම්මාන 15 ක පමණ ජනතාව නගරයට ප්‍රවිෂ්ඨ වන ප්‍රධාන මාර්ගය වන අතර අප අවුරුදු 30ක පමණ කාලයක් මෙය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස කොපමණ ඉල්ලීම් කලද එය ඉටු නොවිනි.එහෙත් සුළිකුනාටුව නිසා සම්පූර්ණයෙන් විනාශ වූ මෙම මාර්ගය හදිසියේ වර්තමාන ප්‍රාදේශීය සභා පාලනයට අප කළ ඉල්ලීම මත සතියක් වැනි කෙටි කාලයක් තුල ගරු සභාපතිතුමාගේ සහ කොට්ඨාශභාර ගරු මන්ත්‍රී එච්.එම්.එස්.කේ.බී.හේරත් වැනි මැතිතුමන්ලාගේ පූර්ණ මැදිහත්වීමෙන් පසු මාර්ගය සකස් කර අවශ්‍ය බෝක්කු දමා, බොරළු කියුබ් 60 ක් දමා නියමිත ප්‍රමිතියට සකස් කර දීම සම්බන්ධව ප්‍රදේශවාසී අප සියළුදෙනාගේ සතුට ප්‍රකාශ කර සිටිමු. මෙම මාර්ගය සකස් කර දීම සඳහා ඇස්තමේන්තු ගත කළ මුදල රුපියල් පන්ලක්ෂතිස්හතර දාහක් වුවද ප්‍රදේශවාසින්ගේ ශ්‍රමදායකත්වය හා ප්‍රදේශයේ යන්ත්‍රසූත්‍ර යොදාගනිමින් මෙම කටයුත්ත නිම කිරීමේදී රුපියල් ලක්ෂ නවයක පමණ වටිනාකමින් යුතු වැඩ කොටසක් ඉටු වූ බව ප්‍රදේශ වාසී අප මෙයින් සතුටින් දන්වා සිටිමු. මේ සම්බන්ධව මිදියාල එක්සත් අවමංගල්‍යාධාර සමිතිය 2026.01.04 වන දින ප.ව.2.00ට පැවැත්වූ සංවත්සර මහා සභාවේදී යෝජනාවක් සම්මත කරමින් අප සියළුදෙනාගේ ගරු සභාපතිතුමාට කොට්ඨාශභාර මන්ත්‍රීතුමා ලේකම්තුමිය,තාක්ෂණ නිලධාරිතුමා ඇතුළු සමස්ථ ගරු ප්‍රාදේශිය සභාවට අපගේ ගෞරවනීය ස්තුතිය මෙම සංදේශය තුලින් පිරිනමා සිටිමු. ස්තුතියි. ලේකම්. අත්සන් ලේඛණයක් ඉදිරිපත් කරලා තියෙනවා.

එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය,දෙමළදොර, කටුපොත. සභාපති, ප්‍රාදේශීය සභාව, පඩුවස්නුවර. මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව සභාපතිතුමනි, ආපදා තත්වය හේතුවෙන් අබලන් වූ දෙමළදොර පහලවැව මාර්ගය බොරළු අතුරා ප්‍රතිසංස්කරණය කර දීම පිලිබඳ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට අපගේ ගෞරවාන්විත ස්තුතිය පුද කර සිටින්නෙමු. මෙයට ලේකම්, සභාපති

ස්තුතිවන්ත වෙනවා අපි සංදේශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්.

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**

ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මටත් සංදේශයක් දුන්නා ඉදිරිපත් කරන්න කියලා.එල්.එම්.උපසෝම, සභාපති,ගිරාතලාන දකුණ, අවමංගල්‍යාධාර සමිතිය, ගිරාතලාන. ගරු ලේකම්තුමා ,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව, හෙට්ටිපොල. දියීවා සුලි කුනාටුවකින් විනාශ වුන ගිරාතලාන දකුණ ගම මැද පාර ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව ප්‍රශංසාව පල කිරීම. ඉහත සඳහන් මාර්ගය අවුරුදු ගනනාවක් මතක ඇති කාලයකින් බොරළු ටිකක්වත්, කානුවක් සාදා නොමැත. වරින් වර මෝටර්ග්‍රේඩර් දමා කැපුවද වැසිකාලයට කානු හැරී ගොස් මාර්ගය අබලන් මාර්ගයක් බවට පත්වේ ඉන්පසුව මාර්ගයේ ගමන් කිරීම ඉතාමත්ම අපහසු විනි.දියීවා කුනාටුවෙන් පසුව මෙය ඉතාමත්ම අබලන් තත්වයට පත් විය. මෙම අවස්ථාවේ හෙට්ටිපොල කොට්ඨාශයේ මන්ත්‍රීතුමා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ අවධානයට යොමු කොට සභාවේ තාක්ෂණ නිලධාරි මහතුන්ගේ අධීක්ෂණය යටතේ ඉතාමත්ම කඩිනමින් පාරේ දෙපස කාණු බැකෝ යන්ත්‍ර දමා කපා බොරළු අතුරා සභාවේ යන්ත්‍ර සූත්‍ර දමා ඉතාමත්ම කඩිනමින් පාර ඉතාමත්ම හොදට සාදා නිම කරන ලදි. මෙම කටයුත්තේදී ගමේ වැසියන්ගේ අධීක්ෂණය සිදුවූ අතර ඉතාමත්ම විනිවිද භාවයකින් යුක්තව මෙම කාර්ය ඉටුකල බව ඔබතුමාට ප්‍රකාශ කර සිටිමි. මෙම කටයුත්තට නායකත්වය දැක්වූ සභාවේ සභාපතිතුමාටත් මන්ත්‍රීතුමන්ලාටත්, සභාවේ පොදු කාර්ය මණ්ඩලයටත් රියදුරු මහත්වරුන්ටත් යන්ත්‍ර ක්‍රියාකරු මහත්මාටත්, තාක්ෂණ නිලධාරීන්ටත් ඉතාමත්ම කැපවීමෙන් කාර්ය අවසන් කර දීම සම්බන්ධව ප්‍රදේශවාසීන් වෙනුවෙන් ගෞරවයෙන් ස්තුතිය මෙයින් පුද කර සිටිමි. සභාපති, ගිරාතලාන අවමංගල්‍යාධාර සමිතිය, ගිරාතලාන දකුණ, හෙට්ටිපොල.

**<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි,මටත් සංදේශ කීපයක් ලැබිලා තියෙනවා. ඉන් මං එකක් සභාවට ඉදිරිපත් කරන්නම් කාල වේලාව යන නිසා .ගම්වාසීහු,දෙමටව දේවාල පාර, දෙමටව, මොරගනේ,සභාපති, ප්‍රාදේශීය සභාව, පඩුවස්නුවර. සභාපතිතුමනි, දෙමටව දේවාල හන්දියේ සිට දෙමටව මහ වැව දක්වා පාර පිලිසකර කර දීම සම්බන්ධව. ඉහත සදහන් දෙමටව ගමේ දේවාල හන්දියේ සිට දෙමටව වැව දක්වා පාර අප දන්නා පරිදි කිසිම දිනෙක මේ ලෙස අළුත්වැඩියාවක් කර නොමැත.පහුගිය දිනවල අප රටටම බලපෑ දියීවා සුළිකුණාටුව නිසා ඇදහැළුණු ධාරානිපාත වර්ෂාවෙන් මෙම පාර සෝදා පාලුවට ලක් වූ නිසා දෛනිකව ගමන් බිමන් යන අය රැකියා සඳහා යන අය මෙන්ම ප්‍රදේශයේ බොහෝ දෙනෙක් අසිරුතාවයට පත් වූහ. පාර කඩිනමින් අළුත්වැඩියා කර දෙන ලෙස ප්‍රදේශවාසින් සභාපතිතුමාගෙන් ලිඛිතව කළ ඉල්ලීමට අනුව එතුමාගේ මැදිහත්වීමෙන් ඉතා කඩිනමින් කාණු කපා බොරළු දමා ක්‍රමවත්ව පාර සකසා ගැනීමට හැකි විය.ප්‍රදේශයේ සභා මන්ත්‍රි දිලිප් ජයසිංහ මහතාගේ සහයෝගයද ඇතිව තාක්ෂණ නිලධාරී මහතාගේ උපදෙස් අනුව ප්‍රදේශවාසින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉටුකළ මෙම කාර්යය කොන්ත්‍රාත්කරුවෙකු මඟින් කලේ නම් මීට වඩා වැඩි මුදලක් වැය වෙනවා මෙන්ම වැඩිකල් නොගොස් පාර පැවති තත්වයටම පත්වනවා නිසැකය.තවද පාර සැකසීමට යෙද වූ මුදල් පිලිබදව දැමූ බොරළු ප්‍රමාණය පිලිබඳව කානු කැපීමට ගිය කාලය හා මුදල පිලිබඳ ප්‍රදේශවාසීන් වූ අප දැනුවත්ව කළ බැවින් එය ඉතාම විනිවිද බවින් ඉටු වූ බවට අපි තරම් දන්නා අය ඇතැයි නොසිතමු. අපි ඊට සාක්ෂි දරමු.එය පහතින් මෙලෙස සටහන් කරමු. කාණු කැපීමට බැකෝයන්ත්‍රයට පැයකට රු.2,500.00 බැගින් පැය 10 ටම රු.25,000.00යි. බොරළු කියුබ් 3 ටිපර් 11 ක් සඳහා එකක් රු.19,500.00 බැගින් රු.214,500.00යි.බොරළු තුනී කිරීම ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදායකත්වයෙන් (කියුබ්33), පාර තැලීම ප්‍රාදේශිය සභාවේ රෝලර් යන්ත්‍රයෙන්. වැයවූ මුළු මුදල රු.239,500.0යි. බොරළු දැමූ දුර ප්‍රමාණය මීටර් 173. මෙම මහඟු කාර්යය කර ගැනීමට ශක්තිය ලබා දුන් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු ප්‍රදේශයේ මන්ත්‍රිතුමාටත්, තාක්ෂණ නිලධාරිතුමාටත් අපගේ කෘතවේදීත්වය පිරිනමන අතර එලොව මෙලොව පිං වැඩෙන මෙවන් කාර්යයන් කිරීමට රජයටත් ඔබතුමාලටත් තව තවත් ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.ස්තුතියි, මෙයට, ප්‍රදේශවාසීහු කියලා අත්සන් කරලා තියෙනවා. විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් තියෙනවා සභාපතිතුමනි. රෝලර් යන්ත්‍රය ක්‍රියාත්මක කරන රියදුරු මහතා මේ පාර රෝලර් කරන්න ආවේ ඉරිදා.එතුමා මං අතින් කිව්වා මන්ත්‍රිතුමා ඔබතුමාලා මේවගේ දේවල් කරද්දි මට පඩි අරගෙන ගෙදරට වෙලා නිදාගන්න බෑ කිව්වා. මගෙ OT පැය සම්පූර්ණයෙන් ඉවර වෙලා තියෙන්නෙ කිව්වා. නමුත් මගෙ යුතුකමක් තියෙනවා කිව්වා මේවට සම්බන්ධ වෙන්න. ඔයගොල්ලො මහන්සි වෙලා වැඩ කරද්දි මගෙත් යුතුකමක් තියෙනවා කියලා ඒ මහත්තයා එහෙම ප්‍රකාශයක් කලා.මං මේ අවස්ථාව ලබා ගන්නවා ඒ මහත්තයාට විශේෂ ස්තුතියක් පුද කරන්න. ඒ වගේම මං විශේෂයෙන් සඳහන් කළ යුතුයි තාක්ෂණ නිලධාරී ෆවුදාන් මහත්මා. අපමණ මහන්සියක් ගත්තා.එතුමට මං විශේෂ ස්තුතියක් පුද කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම් හුසේයින් මහතා පෙ.ව.10.25 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම් හුසේයින් මහතා පෙ.ව.10.29 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ගරු මන්ත්‍රී බී. සුදත් උදය කුමාර මහතා- (ජා.ජ.බ)</u>**

ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. 1417, රත්මලේ ග්‍රාම නිලධාරී වසම, රත්මලේ එක්සත් තරුණ සංසදය ලේකම්තුමිය, ප්‍රාදේශීය සභාව, පඩුවස්නුවර.ආපදා මාර්ග ප්‍රතිසංස්කරණය පිලිබඳ ජන ප්‍රසාදය පළ කිරීම.අංක 1417 රත්මලේ විද්‍යාලය අසල සිට ගනේගොඩ ග්‍රාමය දක්වා මාර්ගය නොවැම්බර් මස ඇති වූ සුළි කුනාටු තත්වය හේතුවෙන් සම්පූර්ණයෙන් සෝදා පාලුවට ලක්වූ මාර්ගයේ ගමන් කළ නොහැකි තත්වයටම පත් විය. එමෙන්ම අප වසම තුලම ගල්ලිද හේන මාර්ගයද දැඩි සේ සෝදා පාළුවට ලක් වන අතර ඒ නිසා එම මාර්ග හරහා ගමනාගමන කටයුතුවලට විශාල බාධාකාරී තත්වයක් ඇති විය.මෙම මාර්ග වසර 10 ක පමණ කාලයක

සිට සකස්කල යුතු මට්ටමට පත්ව තිබුනද මේ තාක් එම කාර්ය සිදු වී නොතිබිනි. පාසල් දරුවන්ට පාසලට පැමිණීමටද දැඩි දුෂ්කරතා තත්වයට පත්ව තිබුණි. ආපදා තත්වය සමඟ සිදු වූ හානියත් සමඟ අප විසින් ප්‍රාදේශිය සභාවට කරන ලද ඉල්ලීම මත ඉතා කඩිනමින් එම මාර්ග දෙක ප්‍රතිසංස්කරණය කොට ජනතා අයිතියට පවරා දෙන ලදි. මෙමගින් පාසල් දූවා දරුවනටද, රැකියා සඳහා යන්නන්ටද ප්‍රදේශවාසී අප සැමටද යහපතක් සිදු වූ අතර අප ප්‍රදේශයේ මාර්ග සංවර්ධනයක්ද සිදු විය.එබැවින් මේ පිලිබද ප්‍රදේශවාසී අප සැමගේ ගෞරවනීය ස්තුතිය සභාපතිතුමා, ලේකම්තුමිය තාක්ෂණ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සැමට පිරි නමමු.ලේකම්, රත්මලේ එක්සත් තරුණ සංසදය.

<u>ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා- (ජා.ජ.බ)</u>

ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි මටත් සංදේශ කීපයක් ලැබුනා මාර්ග බොරළු දැමීම සම්බන්ධයෙන් ස්තුතිය පල කරලා. ඉන් එකක් මං ඉදිරිපත් කරන්නම්.මාර්ගය භාවිතා කරන පිරිස, පරණ පන්සල් මාවත, රදළියගොඩ, කටුපොත. ගරු සභාපතිතුමා, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව, හෙට්ටිපොල. ස්තුතිය පල කිරීම සඳහා. පඩුවස්නුවර අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අංක 1379 දරණ කනෝගම ග්‍රාම සේවා වසමට අයත් රදලියගොඩ ග්‍රාමයේ පිහිටි පරණ පාසල් මාවතට බොරළු දැමීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කර දී එම කාර්ය අප සැමගේ අධීක්ෂණය යටතේ අවංක භාවයෙන් හා නිවැරදිව අප සැමට ගමන් කිරීම සඳහා ඉතාම සුදුසු අන්දමින් නිම කර දීම පිලිබඳව අපගේ ස්තුතිය හා ප්‍රණාමය ඔබතුමාට පුද කරන්නෙමු. මෙයට ප්‍රදේශවාසීන්. පාර බොරළුදාලා සංවර්ධනය කරලා තියෙනවා. අපි ස්තුති කරන්න ඕන තාක්ෂණ නිලධාරිතුමාට. ඒ අය ඉල්ලුවෙත් නෑ. උඩින් වතුර යන නිසා කානු කැටත් දාන්න සිද්ධ වෙලා තියෙනවා කියලා තාක්ෂණ නිලධාරිතුමා ප්‍රකාශයට පත් කරලා. සභාවෙන් කානු කැටත් දාලා ඉතාමත්ම සුපිරිම විදිහට ඒවා නිම කරලා තියෙනවා.

<u>ගරු මන්ත්‍රීනී ර්.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)</u>

ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මටත් සංදේශයක් ලැබිලා තියෙනවා.ටී.එම්.රම්‍යසිරි බංඩාර, කුරුඳු කුඹුර, හෙට්ටිපොල. සභාපති, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව, හෙට්ටිපොල. ගරු සභාපතිතුමනි, ඉහල මලගනේ කුරුඳු කුඹුර මාර්ගය ප්‍රතිසංස්කරණය. දිධීවා සුළි කුණාටුව සමඟ ඇති වූ අධික වර්ෂා වෙන් දැඩි ලෙස අබලන් වූ ඉහල මළගනේ කුරුඳුකුඹුර මාර්ගය මෙත්තා සුහද කවය සහ ප්‍රදේශවාසින්ගේ ඉල්ලීම මත ප්‍රාදේශීය සභාවට වෙන්වූ ප්‍රතිපාදන මත මාර්ගයේ කානු කපා, බොරළු යොදා ගමනාගමනයට සුදුසු තත්වයට පත්කර දීම සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රිමණ්ඩලයටත් ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම්තුමිය ප්‍රධාන නිලධාරි මණ්ඩලයටත් ප්‍රදේශවාසීන් ලෙස ස්තුතිවන්ත වෙමු. වසර 20 කට අධික කාලයක් නිසි ලෙස ප්‍රතිසංස්කරණය නොකල මාර්ගයක් වන මෙය ප්‍රාදේශීය සභාවේ තාක්ෂනික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විධිමත් මාර්ගයක් බවට පත් කිරීම සම්බන්ධයෙන් පහත අත්සන් යෙදූ ප්‍රදේශවාසීන් ලෙස ස්තුතිය පුද කරමු.ස්තුතිය ප්‍රකාශ කරලාඑවලා තියෙනවා ප්‍රදේශවාසීන්.

<u>ගරු මන්ත්‍රීනී එස්.එම්. සජිනා සුරංගි මහත්මිය- (ජා.ජ.බ)</u>

ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු රජයේ නිලධාරීන්ගෙන් අවසරයි. සැමටම සුභ අළුත්අවුරුද්දක් වේවා සියළුදෙනාටම.හාස්‍යයට ලක් වෙන්නවත් අපිට ස්තුතියක් පල කර ගන්නවත් මේ සංදේශ ඉදිරිපත් කරනවා නෙමේ. ඒක විශේෂයෙන් කියන්න ඕන. අපි වැඩ කරන්න ගියාම මිනිස්සු අපිට කියපු දේවල් තිබ්බා.මෙහෙම ස්තුතිකරලා ඔයගොල්ලො සංදේශයක් දෙන්න. අපි ගිහින් කියවන්නම් කියලා. මට සංදේශ 4 ක් දීලා තිබුනා සභාපතිතුමනි. මං ඉන් එකක් විතරක් ඉදිරිපත් කරන්නම්.ප්‍රජා සංවර්ධන සභාව, මහවෙල ඇපලදෙණිය, ගරු සභාපතිතුමා, ලේකම්තුමිය, ප්‍රාදේශීය සභාව , පඩුවස්නුවර.ගෞරව පූර්වක ස්තුතිය පුද කිරීම සඳහා. පසුගිය කාලය තුළ ඇති වූ දිධීවා සුළි කුණාටුව හා පෙර ආපදාවට පත්ව තිබූ අපගේ කරගහගෙදර කොට්ඨාශයේ ඇපලදෙණිය මහවෙල ප්‍රධාන මාර්ගය තැලවිල්ල දක්වාම බොරළු අතුරා අප ගම්වාසීන් හට ගමන් කිරීමට පහසු අන්දමට සකස් කර දී ඇත.වසර 30 ක් 40 ක් පමණ කාලයක සිට දේශපාලන අධිකාරියට මෙම මාර්ගය පිලිබඳ දැනුවත් කළද ඔවුන්

කිසිවෙකුත් මේ පිලිබඳව සැලකිල්ලක් නොදැක්වූ අතර ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් මෙම මාර්ගය පිලිසකර කර දීම පිලිබඳ ප්‍රදේශවාසීන් වන අපහට ඇත්තේ ඉතාමත් භක්තියක් සහ පැහැදීමකි. එම නිසාවෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාටත් ලේකම්තුමියටත් අප ප්‍රදේශයේ මන්ත්‍රීතුමිය ඇතුළු ඒ සඳහා ඇප කැපවූ සියළුදෙනාටමත් අපගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරන්නෙමු. ස්තුතියි.මෙයට ඇපලදෙනිය මහවෙල ප්‍රදේශවාසින්.මෙකෙ අත්සන් සහිතව තියෙනවා.

<u>**ගරු මන්ත්‍රී කේ.එම්. අජිත් තිලකසිරි මහතා - (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමනි, මන්ත්‍රි වරුනි ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. සිරිසඟබෝ අවමංගල්‍යාධාර සමිතිය, දිග්ගලගෙදර, මණ්ඩපොල, ගරු සභාපතිතුමා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,හෙට්ටිපොල, ස්තුතිය පුද කර සිටීම.පසුගිය දීයීවා සුළිකුණාටුව තත්වයෙන් පැවති අධික වර්ෂාව හේතුවෙන් දිග්ගලගෙදර තාවල්ලේ වැව අසල සිට දිග්ගලගෙදර විහාරස්ථානය දක්වා දිවෙන මාර්ගය දැඩිසේ අබලන් වීම හේතුවෙන් ගමනාගමනයට බාදා එල්ලවී තිබූ මොහොතක ඔබ සභාව විසින් මූලිකත්වය ගෙන කිසිදු කොන්ත්‍රාත්කරුවන්ගේ මැදිහත්වීමකින් තොරව අප සාමාජිකයින් සහ ගම් වාසින්ගේ එකමුතුවෙන් බොරළු අතුරා ගමනාගමනයට සුදුසු අයුරින් සකස් කර ගන්නා ලදි. ඉහත මාර්ගය ආසන්නයේ අප සමිති ශාලාව පිහිටා ඇති අතර දැනට ආපදාවකින් තොරව අදාල මාර්ගයේ ගමන් කිරීමට අවස්ථාව සලසා දුන් ඔබතුමා ඇතුළු කාර්ය මණ්ඩලය වෙත මෙසේ ස්තුතිය පුද කර සිටිමු. මීට වැඩියමක් ඉදිරිපත් කරන්නත් ඕන මේ මාර්ගය පිලිබදව.විශේෂයෙන් දිග්ගල ගෙදර විහාරස්ථානය කියලා කියන්නෙ. අපේ ප්‍රදේශයේ තියෙන විශාලම දහම් පාසල පැවැත්වෙන විහාරස්ථානය. දහම් පාසලේ ළමුයිනුත් භාවිතා කරන්නෙ මේ මාර්ගය. වසර ගණණාවක් තිස්සෙ මේ පාර හුඟක් අබලන්ව තිබ්බා.අපේ සූජීව හේරත් මන්ත්‍රිතුමත් එතුමගෙ කාලෙ ගොඩක් උත්සාහ කලා මේ පාර ගොඩනගන්න. නමුත් කුමන හෝ හේතුවක් හින්දා එතුමට බැරිවුනා.ඒක කරගන්න.

<u>**ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සූජීව හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**</u>

සභාපතිතුමා ඒ අවස්ථාවේ පන්සල හරහා යන හින්දා ලක්ෂ 50 ක් යොදවලා කාපට් එක දැම්මා.

<u>**ගරු මන්ත්‍රීනී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමනි මටත් සංදේශ ලැබිලා තියෙනවා. මං ඒකෙන් එකක් කියන්නම්. ප්‍රජා සංවර්ධන සභාව, දෝතැල්ල සුනන්දපුර, ගරු සභාපතිතුමා ප්‍රාදේශීය සභාව පඩුවස්නුවර දියීවා සුලි කුණාටුව හේතුවෙන් අබලන් වූ දෝතැල්ල පන්සල අසල සිට හේන්යාය මාර්ගය දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව ස්තුතිය පුද කිරීම.අප දෝතැල්ල ප්‍රදේශයේ පදිංචිවැසියන් ලෙස දියීවා සුළිකුණාටුව හේතුවෙන් අබලන් වූ මෙම මාර්ගය අපගේ කාරුණික ඉල්ලීම සලකා බලා ඉතාම කඩිනමින් උපරිම ඵලදායිතාවයෙන් යුතුව ගමනාගමනය පහසුවන ආකාරයට මෝටර්ග්‍රේඩරය දමා පාර දෙපස කාණු පද්ධතිය සුද්දකර අවශ්‍ය ප්‍රමාණයට බොරළු අතුරා අපේ මාර්ගය කෙටිකාලයක් තුල ප්‍රතිසංස්කරණය කර දීම සම්බන්ධව ගම්මුන් ලෙස අපගේ හෘදයාංගම ස්තුතිය පළ කරමු.මෙයට මාර්ගය භාවිතා කරන ගම්වාසීන්

## (ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත

## (ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා

<u>**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**</u>

එම්.ටී.එම් තස්ලිම් මන්ත්‍රිතුමා විශේෂ ප්‍රකාශයක් කරන්න යෝජනාවක් ගෙනල්ලා තියෙනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරගන්න.

<u>**ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා - (ස.ල.ම.කො)**</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමියගෙන් අවසරයි.මන්ත්‍රිතුමන්ලා තුමියන්ලාගෙන් සහ නිලධාරීන්ගෙන් අවසරයි .සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා.මං විශේෂ ප්‍රකාශයක් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනවා.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**</u>

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති විශේෂ ප්‍රකාශයක් කිරීමේ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>
ඩී.ඩී.එස්. පද්මලාල් දොලවත්ත මන්ත්‍රීතුමා විශේෂ ප්‍රකාශයක් කරන්න යෝජනාවක් ගෙනල්ලා තියෙනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරගන්න

<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>
සුභ උදෑසනක් වේවා සියළුදෙනාටම. ඒ වගේම සභාපතිතුමා, ලේකම්තුමිය, ගරු මන්ත්‍රීමණ්ඩලය ඒ වගේම ලේකම්තුමියගේ කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන්ම අවසරයි.මටත් අද දින විශේෂ ප්‍රකාශයක් කිරීම සඳහා මං මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>
එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති විශේෂ ප්‍රකාශයක් කිරීමේ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අදාලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛණය මහ සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න මා විසින් යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>
2026 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛණය අනුමත කිරීමේ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති 2026 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛණය අනුමත කිරීමේ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>
මීළගට සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛය 1/2020 යටතේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න මා විසින් යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>
ගරු සභාපතිතුමා ඇතුළු ලේකම්තුමියගෙන් අවසරයි. සුළු මුදල් අත්තිකාරම් සම්බන්ධව යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති සුළු මුදල් අත්තිකාරම් සම්බන්ධව යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ඒ වගේම ග්‍රාමීය ප්‍රදේශවල දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවල අනුකූලතා ගාස්තු අය කර ගැනීම සම්බන්ධ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න මා විසින් යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරපු එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීවකරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

බන්දුල සමරවික්‍රම ගරු උපසභාපතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් උපාලි මන්ත්‍රීතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරගන්න

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, අපේ හිටපු සභාපතිවරයෙක් ඒ වගේම වර්තමාන ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී රංජිත් උපාලි මන්ත්‍රීතුමා අසනීප වෙලා තියෙනවා.එතුමට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සඳහා මං යෝජනාවක් ඉදිරිපත් කළා.එය න්‍යාය පත්‍රයට ඇතුලත් කර ගැනීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගැනීම සුදුසුයි කියන යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ඒ වගේම නිකසල පුරවරයක් -සුවබර දිවියක් පසු ආපදා පවිත්‍රතා ඩෙංගු මර්දන ජාතික වැඩසටහන සම්බන්ධ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න මා විසින් යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරපු එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීවකරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ගරු මන්ත්‍රිනී සද්නා දිල්හානි මහත්මිය ගංවතුර නිසා සෝදාපාළුවට ලක් වූ ගම්මානයට ඇති ප්‍රධානම පාර සංවර්ධනය කිරීම වෙනුවෙන් විශේෂ යෝජනාවක් ගෙනල්ලා තියෙනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරගන්න

**<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ගරු සභාපතිතුමා මන්ත්‍රිමණ්ඩලය, ලේකම්තුමිය , කාර්ය මණ්ඩලය සියළුදෙනාගෙන් අවසරයි.ගංවතුර හානි නිසා ගමට පිවිසුම් මාර්ගය හානි වෙලා තියෙනවා. ඒක ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)</u>**

සභාවෙන් අවසරයි. මා විසින් ඒ යෝජනාව ස්ථිර කරනවා

**ඒ අනුව ගරු මන්ත්‍රිනී අයි සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ගරු මන්ත්‍රිනී එම් නිශාන්ති ගුණතිලක මන්ත්‍රිතුමිය සියඹලාකඩවර සිට යායේගෙදර ගම මැද පාර පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරගන්න

**<u>ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

සියළුදෙනාගෙන් අවසරයි.සියඹලාකඩවර සිට යායේගෙදර ගම මැද මාර්ගය සංවර්ධනය කිරීමේදී අඩි 14 සිට අඩි 10 දක්වා පටු කිරීම සම්බන්ධව යෝජනාව මා සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)</u>**

සභාවෙන් අවසරයි.ඒ යෝජනාව මා ස්ථිර කරනවා

**ඒ අනුව ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය_විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ගරු මන්ත්‍රි එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතාගල්කන්ද වන විනාශය සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරගන්න

**<u>ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ලේකම්තුමිය මන්ත්‍රිමණ්ඩලය සියළුදෙනාගෙන් අවසරයි.ගල්කන්ද වතුයායේ වන විනාසය සම්බන්ධ යෝජනාවක් මං සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)</u>**

සභාවෙන් අවසරයි.ඒ යෝජනාව මා ස්ථිර කරනවා

**ඒ අනුව ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ_මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඉ)** 1.**<u>සභාවේ කමිටු පත් කිරීම</u>**

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

මා විසින් කල් තැබූ යෝජනාව ඉදිරිපත් කිරීම

(1) **මුදල් සහ ප්‍රතිපත්ති කමිටුව පත්කිරීම හා බලතල පැවරීමේ යෝජනාව**

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - සභාපති -(ජා.ජ.බල)
2. ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බල)
3. ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා-(ජා.ජ.බල)
4. ගරු මන්ත්‍රී එස්.එච් මාලක අරුණ කුමාර මහතා-(ජා.ජ.බල)
5. ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය-(ජා.ජ.බල)
6. ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා-(ජා.ජ.බල)
7. ගරු මන්ත්‍රී එච්.එම්. සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා -(ජා.ජ.බල)
8. ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා- (ජා.ජ.බල)
9. ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)
10. ගරු මන්ත්‍රීනී ආර්.එම් නිලන්ති විජේසිංහ මහත්මිය - (ස.ජ.බ.)
11. ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම් චාන්දනි දීපිකා රත්නායක මහත්මිය - (ස.ජ.බ)
12. ගරු මන්ත්‍රීනී බී.එම්. ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය-(ස.ජ.බ)
13. ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා - (ස.ල.ම.ක්‍රොං)
14. ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා- ( එ.ජා.ප)
15. ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - (ස.ජ.බ)
16. ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා - ( සර්ව ජන බලය)
17. ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.පො.ජ.පෙ)

ඒ වගේම අතුරු ව්‍යවස්ථාව අනුව සිවිල් පුරවැසියන් 03 ක් නම් කරන්න කියලා තියනවා. ඒ සඳහා

18. විශ්‍රාමික ගරු නිලන්ති සියඹලාපිටිය මහත්මිය
19. විශ්‍රාමික ගුරු ලලිතා කොටුආරච්චි මහත්මිය
20. ගණකාධිකාරී ඒ.යූ සනත් උදයකුමාර මහතා

**<u>ගරු මන්ත්‍රීනී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා නම් කළ මුදල් කමිටු යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, මුදල් කමිටුව පත් කිරීම සම්බන්ධව අපි විරෝධතාවය ප්‍රකාශ කරනවා.අපි ඔබ තමුන්නාන්සෙට කීප වතාවක් කිව්වා වැඩි බලයක් තියෙන්නෙ විපක්ෂයට කියලා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ගරු මන්ත්‍රි මනෝකුමාර එදිරිසිංහ මන්ත්‍රිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)</u>**

සභාපතිතුමනි මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතෙ 6 වන පිටුවෙ තියෙනව වගන්තියක් 14.1 ප්‍රාදේශීය සභාවක් විසින් තීරණය කරනු ලැබිය යුතු යයි මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ බලය පවරනු ලැබ ඇති සියලු කරුනු සහ ප්‍රශ්න මේ පනතේ විධිවිධාන වලට අනුකූලව පවත්වනු ලබන ප්‍රාදේශීය සභාවෙහි යම් රැස්වීමකට පැමිණ සිටින සභිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

මුදල් කමිටුව සඳහා සංශෝධන යෝජනාව ලෙස මම මේ නම් සඳහන් මන්ත්‍රිවරු සහ මන්ත්‍රිවරියන් යෝජනා කරනවා.

1. ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා
2. ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා
3. ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා
4. ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා
5. ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා
6. ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා

7. ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය
8. ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
9. ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
10. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
11. ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
12. ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
13. ගරු මන්ත්‍රීනී එස්.එම්. සජිනා සුරංගි මහත්මිය
14. ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා
15. ගරු මන්ත්‍රී එච්.එම්. සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා

**ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**

හරි ඡන්දෙකට යමු.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි බහුතර ඡන්දය තේරීම සඳහා රහස් ඡන්දයක් තිබීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)**

විවෘත ඡන්දයක් තිබීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**

හොඳයි.ඒ සඳහා යෝජනා 2 ක් ඇවිල්ලා තියන නිසා ඡන්දය පවත්වන්නෙ කුමන ආකාරයකටද කියලා බලන්න ඡන්දයක් තියන්න වෙනවා. ඒ නිසා ඒක විවෘතව තියන්න නෙමේ.රහස් ඡන්දයක් තියනවා.රහස් ඡන්දයට යෝජනාවක් තියෙනවා.විවෘත ඡන්දයට යෝජනාවක් තියනවා.යෝජනා දෙකක් තියන නිසා ඒක තීරණය කිරීම සඳහා තියන ඡන්දය රහස් ඡන්දයක් .මං ලේකම්තුමියට නියෝග කරනවා.ඡන්දය තියන ක්‍රමය තීරණය කරන්න රහස් ඡන්දයක් පවත්වන්න සූදානම් කරන්න කියලා.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**

ඡන්දය සඳහා කටයුතු සූදානම්.රහස් ඡන්දයද විවෘත ඡන්දයද කියලා බලන්න තියන්නෙ රහස් ඡන්දයක්.ඒකෙදි ඡන්ද පත්‍රිකාව තියනවා. විවෘතද රහස්‍යද කියලා යට කොටුවක් තියෙනවා.ඡන්දය භාවිතා කරන්නෙ විවෘත ඡන්දයකට නම් ඒ කොටුවේ කතිරය ලකුනු කරන්න.රහස් ඡන්දයට නම් ඒ කොටුවෙ කතිරය සලකුණු කරන්න තියෙන්න.ලේකම් තුමිය දැන් ඡන්දය ආරම්භ කරන්න.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ලේකම්තුමිය අපි ඔබතුමියට භාර දීලා තියෙනවා අත්සන් ලේඛණය කින් යුතුව.ඔබතුමිය ඒකට ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාවෙන් අවසරයි.ඡන්දය තියන්න ඒකෙ ගැටළුවක් නෑ.ඔබතුමාගෙ කැමැත්ත නම්.පනතට විරුද්ධව කොමසාරිස්තුමියගේ උපදෙස්මත ලේකම්තුමිය අද දින ඡන්දය පවත්වන්න කටයුතු කරා කියන එක වාර්තා ගත කරන්න.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**

ඡන්ද ක්‍රමය තෝරා ගැනීම සඳහා වූ ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රථිපල සටහන මහ සභාවට ඉදිරිපත් කරනවා.

රහස් ඡන්දයට පක්ෂ ඡන්ද ප්‍රමාණය - 21

විවෘත ඡන්දයට පක්ෂ ඡන්ද ප්‍රමාණය - 15

යෝජනාව සඳහා ඡන්දය දීමෙනි වැලකී සිටි ප්‍රමාණය -නැත
යෝජනාවට ඡන්දය විමසන අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි ප්‍රමාණය - නැත
2026.01.06 දින සභාව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව- 01
මුළු එකතුව- 37
වැඩි ඡන්ද සංඛ්‍යාව- 06

ඒ අනුව වැඩි ඡන්ද 06 කින් රහස් ඡන්දයක් පැවැත්වීම සුදුසුයි යන්න තෝරා පත් කරගෙන තියෙනවා.ඒ අනුව 2026 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා දෙවනි(සංශෝධන) යෝජනාව ගරු මන්ත්‍රි චාමින්ද දසනායක මහතා යෝජනාකල යෝජනාවට පක්ෂද විපක්ෂද කියලා ඡන්දය විමසන්න යන්නෙ. ලේකම්තුමිය ඡන්දය පවත්වන්න පටන්ගන්න.

විරෝධය පළ කරමින් පහත සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ මන්ත්‍රිතුමියන්ලා පෙ.ව 11.55 ට පමණ සභාගර්භයෙන් පිටට ගියා.

1. ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා
2. ගරු මන්ත්‍රී ඒ.පී. තරංග චම්පික අලහකෝන් මහතා
3. ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
4. ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා
5. ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
6. ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා
7. ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
8. ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
9. ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය
10. ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා
11. ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා
12. ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
13. ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා
14. ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා
15. ගරු මන්ත්‍රීනී බී.එම්. ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
16. ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
17. ගරු මන්ත්‍රීනී ආර්. එම්. නිලන්ති විජේසිංහ මහත්මිය - ( ස.ජ.බ)
18. ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා - ( ස.ජ.බ)

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

බොහොම ස්තුතියි.ගරු මන්ත්‍රිතුමන්ලා තුමියන්ලාට. තියපු ඡන්දෙදි සංශෝධන යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵල සටහන මා විසින් මහ සභාවට ඉදිරිපත් කරනවා.
යෝජනාවට පක්ෂ ඡන්ද ප්‍රමාණය - 02
යෝජනාවට විපක්ෂ ඡන්ද ප්‍රමාණය - 16
අයවැය යෝජනාව සඳහා ඡන්දය දීමෙනි වැලකී සිටි ප්‍රමාණය - නැත
යෝජනාවට ඡන්දය විමසන අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි ප්‍රමාණය - 18
2026.01.06 දින සභාව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව- 01
මුළු එකතුව- 37
වැඩි ඡන්ද සංඛ්‍යාව- 14
ඒ අනුව වැඩි ඡන්ද 14 කින් සංශෝධන යෝජනාව පරාජයට පත් වුනා.
ඇත්තටම මට කියන්න ඕනකම තියනවා. විපක්ෂෙ මන්ත්‍රිවරු මෙතනින් නික්ම ගියා.තස්ලිම් මන්ත්‍රිතුමත්, දොලවත්ත මන්ත්‍රිතුමත් හැර අනිකුත් සියළුදෙනා නැගිටලා ගියා.අපි සභාව ආරම්භ කරලා මාස 7 කට

ආසන්න කාලයක් වෙනවා. මේ කාලෙ ඇතුළත අපි ආණ්ඩු ව බලාපොරොත්තුවන විනිවිදභාවයකින් , මුදල් හොරකම් නොකර,වංචා නොකර මේ ප්‍රාදේශීය සභාව ගොඩනැගීම සඳහා අපි පොර බදිමින් සිටිනවා.මේ විරුද්ධ වෙන්නෙ, දහලන්නෙ, ඇත්තටම පහුගිය මාර්ග ප්‍රතිසංස්කරණයදී අපි දන්නවා සමහර මන්ත්‍රීවරු බොරළු කපන තැන්වලට ගිහිල්ලා දහලලා තිබුනා බොරළු හොයන්න.මොකටද පාරවල් වලට දාන්න නෙමේ විකුණන්න.එහෙම සංස්කෘතියක් තියන අය තමයි දැන් මේ සභාවට ඇවිල්ලා බොරුවට කැගහලා සද්දෙ දාලා තර්ජනය කරලා,ලේකම්තුමියට තර්ජනය කරලා මේ ඡන්දය දෙන එක වලක්වන්න උත්සාහ කලේ.රහස් ඡන්දයෙදි ඡන්ද 21 ක් රහස් ඡන්දයට එකඟයි කියලා ඡන්දෙ ලබා දුන්නා.අපි දන්නවා ඒ ලබා දුන්නෙ විපක්ෂයේම හෘදසාක්ෂියක් තියෙන අළුත් අය වෙන්නත් පුළුවන් පරණ අය වෙන්නත් පුළුවන්. හැබැයි හෘද සාක්ෂියක් තියෙන අය.හොරකමට, වංචාවට,දූෂණයට විරුද්ධ අය තමයි ඒ ඡන්දය දුන්නෙ ඒ අයට අපේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. ඒ නිසා අපිත් එක්ක අත්වැල් බැදගත්ත මන්ත්‍රීතුමාලා, තුමියන්ලාට අපි කියනවා. ඉදිරියට මේ සභාව අපි ලස්සනට පවත්වාගෙන යමු.පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව අනිත් ප්‍රාදේශීය සභාවලින් ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක්, ලස්සනට හදපු ප්‍රාදේශීය සභාවක් බවට පත් කරමු. ඇත්තටම පාරවල්වල ගියපු අය දන්නවා වැඩසටහනට මැදිහත් වෙච්චි අය දන්නවා.කොච්චර පිලිවෙලට කොච්චර ලස්සනට ඒ පාරවල් ටික හදලා තිබ්බද, බොරළු ඇටෙකින් සත 5 ක් වත් වංචාවක් සිද්ධ වෙන්නෙ නැතිව ඒ පාරවල් හැදුවද කියන්න ඒ ගම්වල මිනිස්සු දන්නවා. මැදිහත් වුන මන්ත්‍රීතුමන්ලා දන්නවා. සම්බන්ධ වුන නිලධාරීන් දන්නවා. සම්බන්ධ වුන ග්‍රාමසේවා වසම්වල නිලධාරීන් දන්නවා.ඒ නිසා මේ වැඩේ ඉස්සරහට පවත්වාගෙන යමු. න්‍යාය පත්‍රයට යමු අපි.

<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>

සභාපතිතුමා මට විනාඩි කීපයක් ලබා දෙන්න.ගරු සභාපතිතුමා ලේකම්තුමිය, ලේකම්තුමියගෙ කාර්ය මණ්ඩලය, සියළු මන්ත්‍රීමණ්ඩලය,මාධ්‍යවේදී සියළුදෙනාගෙන් අවසරයි.වචන කීපයක් කතා කරලා ගියාට පස්සෙ ගෙදර ගිහිල්ලා හිරවෙන්නෙ නැතිව ඉන්න පුළුවන්.ප්‍රෙෂර් එක එළියට තල්ලුකරලා මට මෙතනින් නික්ම ගියහැකි.විශේෂ ප්‍රකාශය කරන එක පසුවට කල් තැබුවත් යම් කරුණු කීපයක් මා විසින් කිව යුතුයි කියලා මට හැගී යන නිසා මං ටිකක් කතා කරනවා.ඇත්ත වශයෙන්ම මේ කලකිරීමට හේතු දක්වන්න එය ඇසිය යුතු කණ්ඩායම මේ අවස්ථාවේ මේ සභාවෙ නොමැති නිසා මං ඒ ගැන ප්‍රකාශ කරන්න යන්නෙ නෑ.ඒ වගේම ආන්ඩු පක්ෂයේ සභාපතිතුමා ඇතුළු අනිත් අය දැනුවත් කිරීම සඳහා මගේ ස්ථාවරය කුමක්ද කියලා පැහැදිලි කිරීම හොඳයි කියලා හිතුනා. ඇත්ත වශයෙන්ම මම මෙතනදි අදහස් කලේ.මට මේ සභාවේ සභාපතිතුමා මාව අල්ලගන්න සංතෝෂම් මොනවවත් දීලා මාව අල්ලාගත්තා නෙමේ.වෙන කෙනෙක් මාත් එක්ක සාකච්ඡා කරලා ගත්ත තීරණයකුත් නෙමේ. හෘද සාක්ෂියට එකඟව මනුස්සයෙක් ගත යුතු තීන්දුවක් මං අරගෙන පවතින රජයට පක්ෂපාතී වුනේ මේ අවස්ථාවේදී.හේතුව දේශපාලනයට පිවිසෙන්නෙ ගමට යම් සේවයක් කිරීමේ බලාපොරොත්තුවෙන්.ඒ වගේම අලුත් පක්ෂයක සංවිධායක වරයෙක් පඹුවස්නුවර ආසනේ. මං හැමදාම කියනවා වගේ සභාපතිතුමත් , මමත් , දසාසිරි මහත්මයත් කියන අපි තුන්දෙනා තමයි. මේ සංවිධායකවරු තුන්දෙනෙකුට ඉන්නෙ.එතකොට කොතෙක් දුරට මගෙ පක්ෂය ගොඩනැගෙනවද මං කොහොමද යන්නෙ කියන එකත්, ඊළඟට මං ඡන්දයක් ඉල්ලනවද, ඉල්ලන්න ජීවත්වෙනවද කියන එක දන්නෙත් නෑ.ඒක නිසා මේ අවස්ථාවේ, වර්තමානයේ මා ක්‍රියාකළ යුතු ලෙස ක්‍රියා කළ යුතුයි.එතකොට මම දන්නවා රට පාලනය කරන්න පාර්ලිමේන්තුව ඉන්නවා.පළාත පාලනය කරන්න පළාත් සභාව නැත්තම් ආණ්ඩුකාරයා ඉන්නවා.ප්‍රාදේශීය සභාව තියෙන්නෙ ගම පාලනය කරන්නත් ගමට සේවය කරන්නත්, ගම පිලිබඳ සොයා බලන්නත්.එතකොට මේ නිසා අනවශ්‍ය ගට්ටන ඇති කරගෙන ඒ කරන සේවයට කකුළෙන් ඇද ඇද යනවා කියන්නෙ ඒ සංවර්ධනයට කරන හානියක්.ඇත්ත වශයෙන් මං ඒකට අකමැති නිසා සහ යම් පුද්ගලයෙක් මේ ලෝකෙ නායකයෙක් තීන්දු තීරණ ගත්තෙ සාමුහිකවට වඩා තනියෙන් .තනියෙන් තීන්දු තීරණ ගත්ත අය තමා නායකයන් වුනේ.ඒක මං හොඳටම දන්නවා. මට කියන්න උදාහරණත් තියනවා.හිට්ලර්ගෙ ඉදන් පටන්ගෙන කියන්න පුළුවන්. හිට්ලර් පළවෙනි කථාව කරනකොට අහන්නෙ නෑ නගරවල අය.අහන්නෙ නැති වුනාට පස්සෙ මිනිස්සු ඇවිල්ලා කිව්වා ඔයා කතා කරන ඒවා කව්රුවත් අහන්නෙ නෑ කියලා.ඊට පස්සෙ මිනිහා අවසානෙට තීරණය කර ගත්තා ගිහිල්ලා

බාරෙකක කතා කරනවා කියලා. බාර් එකක මේසයක් උඩ නැඟලා පළවෙනි කතාව කලේ හිට්ලර්. එකෙක්වත් අහන්නෙ නෑ.සමහර අය වෙරිවෙලා නිදි.එහෙම ඉන්නකොට හිට්ලර්ගෙන් ඇවිල්ලා අහනවා කව්රුත් අහන්නෙ නැනෙ කියලා. මං මේ උත්සාහ කරන්නෙ මේ කට්ටිය දැනුවත් කරන්න නෙමේ.මං යම් දවසකදි මිනිසුන්නෙ හිත්වලට කාවදින්න පුළුවන් වෙන විදිහ සකස්කරගන්න කියලා.ඒ ස්වාධින තීරණ තීන්දු ගන්න පුළුවන් මිනිස්සු.මං අනිත් අයගෙනුත් ඉල්ලීමක් කරනවා.තමන්ට කොන්ද පණ තියෙන්න ඕන.තමන්ට දෙයක් කියාගන්න ප්‍රසිද්ධියෙ ඒකෙ කියාගන්න බැරිනම් ඇත්ත වශයෙන්ම ඔහුට නායකත්වය නෑ. කාගෙ හරි න්‍යාය පත්‍රයකට යනවනම් එතන නායකත්වය නෑ.මං ඉල්ලා සිටිනවා. සභාපතිතුමාගෙන් සංදේශ ඉදිරිපත් කරනකොට මේ මන්ත්‍රිවරු මන්ත්‍රිවරියන් නැගිටලා සංදේශ ඉදිරිපත් කලා. ඒ ගොල්ලො ඉදිරිපත් කරපු කාර්යන් වලදි ඔවුන්ට ලැබුන පැසසුම්වලට .ඒ වගේම අනාගතේ කටයුතු කරන කොට මේ ගරු විපක්ෂයේ මන්ත්‍රිවරුන්ටත් ඔබතුමා ඒ විදිහටම කරන්න පුළුවන් විදිහට මේ ජයග්‍රහණය ඉටු කරලා දෙන්න.මං දැක්කා ජනාධිපතිතුමා කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිනියට කියලා තිබුන කථාව.මට බලය අරන් දෙන්න පුළුවන්,බලය රැකගැනීම ඔබ සතු වගකීමක් කියලා.ඒක එතුමිය නොකල නිසා තමයි එතුමියත් අමාරුවෙ වැටුනෙ.මං ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. විපක්ෂෙ කවුරුවත් මෙතන නැතත් මං විසින් සහ මේ මන්ත්‍රිවරයා විසින් කළ යුත්තේ දැනට සභාවේ අපි දෙන්නා විතරයි.අපි දෙන්නා විසින් කළ යුත්තෙත් විපක්ෂෙ භූමිකාව.පවතින රජයේ වැරදි කිය කිය පෙරලා දැමීම ඒක වෙනමම කාරණාවක්.ඒක තමා මං මුලින්ම කිව්වෙ අපි පාර්ලිමේන්තුවෙ නෙමේ ඉන්නෙ අපි ඉන්නෙ ප්‍රාදේශීය සභාවක ගම් සභාවක.එතකොට මේ ප්‍රාදේශිය සභාව තුල ඉන්නවනම් කොහොමද අපි කටයුතු කරන්න ඕනි කියලා ඔළුවට දාගන්න ඕනි කටයුතු කරන්න.ඒක නිසා අපි මෙතන උඩ කට්ටිය රන්ඩු කරාට මෙතන රණ්ඩු කරලා හරියන්නෙ නෑ. ගමට සේවයක් කරන්න වෙන්නෙ නෑ එතකොට.ඔබතුමා සභාපති ඔබතුමාට පුළුවන් මම දන්නවා ආණ්ඩුකාරවරයාගෙන් ස්පෙෂල් ඔතෝරිටියක් අරගෙන හරි ඔබතුමාගෙ කාර්යය කරගෙන යන්න. ආණ්ඩුකාරතුමාට බලය තියෙනවා පළාත් සභාවක් නැති නිසා විශේෂයෙන්ම.එතකොට ඒ ඔක්කොම හැමදේමත් දැනගෙන කාට හරි කඩේ යන්න ඕනිකමක් නෑ.මල්ල හිල්. දාන ඒවත් නෑ.අන්තිමට නිකම් මනුස්සයෙක් තමයි අවසානෙ බිහිවෙන්නෙ. ඒකනෙ සිද්ධ වුනේ මේ කාල සීමාවෙ.හයවෙනි මාසෙ දහතුන් වෙනිදා ඉදලා සභාවේ මේ වෙනකනුත් වුනේ මේකමයි. ඒක නිසා ඔබතුමාගෙන් මං ඉල්ලීමක් කරනවා.මං මේ ඉල්ලීම කරන්න ප්‍රධානම කාරණාව මගෙ අදහස ඉදිරිපත් කරන්න. ඔබතුමාගෙන් ඉල්ලීම කරන්නෙ විශේෂ ප්‍රකාශය තව කරුණුත් එක්ක මං අවස්ථාව ලැබෙන ඉදිරි දිනයක කරන්නම් උචිතනම් කරන්නම්, උචිත නැත්තම් නොකර ඉන්නම්. නමුත් මේ වෙලාවෙදි මං ප්‍රකාශ කලේ සභාවේ කටයුතු කරනකොට විපක්ෂය වෙනුවෙන් වචන ස්වල්පයක් මං කතා කළ යුතු නිසා.ඔබතුමාගෙන් මං ගෞරවයෙන් ඉල්ලනවා මේ වසර අවසාන වන විට කිසි කෙනෙක් විපක්ෂෙ ඉන්නෙ කියලා කෙනෙක් සිටිය යුතු නැත. පුළුවන් තරම් උත්සාහ කළ යුත්තේ සියළුම මන්ත්‍රිවරු, මන්ත්‍රිවරියන් වැඩ දුන්නහම, වැඩ පවරපුවම, ඒ ගොල්ලො ඒ අයගෙ හිත්වල තියෙන දේවල් අයින් කරගෙන අනිවාර්යයෙන්ම සහය දෙයි. මං දන්නවා ඒ අයගෙ හිත්වල තියනවා කියලා. මං නම් වශයෙන් ප්‍රකාශ නොකලට මගෙන් බොහෝ දෙනා දුරකථනයෙන් කතා කරලත් ඇහුවා ඔබතුමා වෙනස්වෙනවද කියලා. මං කිව්වා වෙනස් වෙන්නෙ නෑ.වෙනස් වෙන කථාවක් නෙමේ මේ කියන්නෙ ගම සංවර්ධනය කරන්න ආවානම් ගම සංවර්ධනය කරන්න ඕන. ඔයා මේ මාස 6 ට කල එක දෙයක් කියන්න කියලා. එහෙම නම් කළ යුතු දෙයක් තියනවා. කළ යුතු දේ තමයි කළ යුත්තේ කියලා. ඔබතුමාගෙන් මං අවසන් වශයෙන් ඉල්ලලා සිටින්නෙ මේ අවුරුද්දේ අපි නැවත වතාවක් ඡන්දයක් පවත්වනවනම් අයවැය යෝජනායක් හරි අන්න ඒ මොහොත වෙනකොට විපක්ෂෙ සියළුම අය ඔබතුමාළඟ සිටිය යුතුයි.ඒ ඉන්න නම් ඔබතුමා විසින් කළ යුත්තෙ මොකක්ද මා විසින් කළ යුත්තෙ මොකක්ද, අනිත් මන්ත්‍රිවරුන් වරියන් කළ යුත්තේ මොකක්ද යන්න තීරණය කරගෙන ඔවුන්ගෙනුත් අදහස් අරගෙන අපි අවසාන අවුරුද්දෙ ජීවත්ව හිටියොත් දේශපාලනය කරමු.අන්තිම අවුරුද්දෙ සංජීව කරුණාසාගර මැතිතුමාටත් සමහරවිට එතුමා පළාත් සභාවට යන්නත් පුළුවන් ඡන්දෙකට.ඒ කොයි වෙලාවෙ ඡන්දෙ පැවතුනත් මොන තරම් හිතවත්කමක් තිබුනත් එදාට මිනිස්සු ඉදිරියේ මතවාද එළි දක්වන්න සිද්ධ වෙනවා.ඒ අවස්ථාවේදී

දේශපාලනය කරන්න සිද්ධ වෙනවා. නමුත් මේ අවස්ථාවෙදි දේශපාලනය කළ යුතු නෑ කියන එක තමයි මගේ මතය.ඒක තමා මට විපක්ෂෙ මන්ත්‍රිවරයෙක් හැටියට කියන්න තියෙන්නෙ.බොහොම ස්තුතියි.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

බොහොම ස්තුතියි මන්ත්‍රිතුමා.න්‍යාය පත්‍රයට යමු අපි. මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ බලතල පැවරීම ඒ අනුව

- රුපියල් ලක්ෂ 20 දක්වා කරනු ලබන සියලු වියදම් අනුමත කිරීම.
- රුපියල් ලක්ෂ 2 ක් දක්වා වූ ගෙවීම් අනුමත කිරීමට සභාපතිතුමා වෙත බලය පැවරීම.
- මූල්‍ය රීති 178 යටතේ ටෙන්ඩර්, ප්‍රසම්පාදන කමිටුව ලෙස කටයුතු කිරීම.ටෙන්ඩර් පිලිගැනීම,අනුමත කිරීම,ලංසු ඇගයීමේ කමිටු නිර්දේශ අනුමත කිරීම.
- මූල්‍ය කටයුතු සම්බන්ධව ප්‍රතිපත්ති තීරණ ගැනීම.
- පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ නව ආදායම් ප්‍රභවයන් හදුනාගැනීම සහ පවත්නා ආදායම් අයකර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව සභාව වෙත යෝජනා ඉදිරිපත් කිරීම.
- වාර්ෂික අයවැය යෝජනා පිළිබඳව නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම.
- සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම , අලුතින් ඇති කර ගත යුතු තනතුරු හඳුනාගෙන එකී තනතුරු අනුමත කර ගැනීමට අදාළ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
- ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය සඳහා නිර්දේශ ලබා දීම.
- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියෙන් ලැබී ඇති බලතල අනුව 126 වගන්තියේ සඳහන් විෂයන් සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථා නිර්දේශ කර මහ සභාව වෙත ඉදිරිපත් කිරීම.
- වරිපනම්,සියලුම බදු හා ගාස්තු නියම කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
- අයකර ගත නොහැකි ආදායම් පිළිබඳව කටයුතු කිරීම.

මා විසින් යෝජනා කරනවා.සම්මත කර දෙන්න.

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට බලතල පැවරීමේ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව මුදල් සහ ප්‍රතිපත්ති කමිටුව පත්කිරීම හා බලතල පැවරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(2).පරිසරය සහ පොදු පහසුකම් කමිටුව පත්කිරීම සහ බලතල පැවරීමේ යෝජනාව**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

1. ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා - මෙම කමිටුවේ සභාපති
2. ගරු මන්ත්‍රී බී සුදත් උදය කුමාර මහතා
3. ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ රංජිත් නවරත්න
4. ගරු මන්ත්‍රී එම් අශෝක හේරත්
5. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
6. ගරු මන්ත්‍රී එස්.එච් මාලක අරුණ කුමාර මහතා
7. ගරු මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය
8. ගරු මන්ත්‍රිනි එස්.එම් සජිනා සුරංගි මහත්මිය
9. ගරු මන්ත්‍රී එච්.එම් ප්‍රදීප් සුජීව හේරත් මහතා

10. ගරු මන්ත්‍රීනි ආර්.එම් නිලන්ති විජේසිංහ මහත්මිය
11. ගරු මන්ත්‍රීනි ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
12. ගරු මන්ත්‍රී සී.පී රංජිත් අබේපාල මහතා
13. ගරු මන්ත්‍රී එම් විරාජ් මලින්ද ඩයස් මහතා
14. ගරු මන්ත්‍රී ඩී.බී.එම් චාමින්ද දසනායක මහතා
15. ගරු මන්ත්‍රී ආර්.ඩී.එම් ජයන්ත දිසානායක මහතා
16. ප්‍රජා සංවර්ධන නිලධාරී-එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
17. සංවර්ධන නිලධාරී - එම්.එම් නිමාලි මහත්මිය
18. සංවර්ධන නිලධාරී - එන්.එල් නෝබට් මහතා

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න.ඇත්තටම දොලවත්ත මන්ත්‍රීතුමා කියපු දේ වගේම ඇත්තටම මේ කමිටුව පත් කිරීමේදී සෑම කමිටුවකට සභාපති වීමේ බලය සභාපතිවරයාට තිබියදිත් මම අපේ උපසභාපතිවරයා තමා මේ කමිටුවේ සභාපති බවට පත් කරලා තියෙන්නෙ.එනිසා අපේ මන්ත්‍රීතුමන්ලා බොහොම සද්භාවයෙන් මේ කටයුත්ත කරගෙන යන්නෙ.මම ඔබතුමාලා ගැන ආඩම්බර වෙනවා.ඔබතුමා ඉල්ලීමක් කරා හැම මන්ත්‍රීවරයෙක්ම විපක්ෂයේ නොවන මන්ත්‍රීවරයෙක් බවට පත් කරගන්න කටයුතු කරන්න කියලා.අපි හරි ආසයි, හරි කැමතියි, ඒ වැඩේට.නමුත් පහුගිය සංවර්ධන කටයුතුවලදී ඒ සමහර මන්ත්‍රීවරු ගම්වලින් ප්‍රතික්ෂේප කරා ඒ තැන් වලට ගියාම මිනිස්සු බැනලා එලව ගත්තා හේතුව තමයි හොරා කාපු උන් ආයෙ මෙහෙ එන්න එපා කියලා. ඒ නිසා ඒ ගොල්ලො සැලකිලිමත් වෙන්න ඕන දැන් ඒ නම නැවත හදාගන්න.මොකද අපේ පාලන කාලය තුල නැවත ආයෙ හොරකම් කරන්න අවස්ථාව දෙන්න බැරි නිසා.

<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව පරිසරය සහ පොදු පහසුකම් කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී**

**(3). කාර්මික සේවා කමිටුව පත්කිරීම සහ බලතල පැවරීමේ යෝජනාව.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - සභාපති
2. ගරු මන්ත්‍රී දිලිප් ජයසිංහ මහතා
3. ගරු මන්ත්‍රීනි නිමල්කා කොටඹගේ මහත්මිය
4. ගරු මන්ත්‍රී ආර්.ඩී.ලාලිත ඉඳුනිල් මහතා
5. ගරු මන්ත්‍රී බී සුදත් උදය කුමාර මහතා
6. ගරු මන්ත්‍රීනි එස්.එම් සජිනා සුරංගි මහත්මිය
7. ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
8. ගරු මන්ත්‍රී ආර්.එම් උපුල් නිශාන්ත මහතා
9. ගරු මන්ත්‍රී එච්.එම් නිශ්ශංක රම්‍යකුමාර හේරත්මහතා
10. ගරු මන්ත්‍රීනි එම් නිශාන්ති ගුණතිලක මහත්මිය
11. ගරු මන්ත්‍රීනි ඩී.නිමාලි දිල්හානි මෙනෙවිය
12. ගරු මන්ත්‍රී එම්. කේ.ආර්.එම්. හුසේයින් මහතා
13. ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා
14. ගරු මන්ත්‍රී කේ.එම් නන්දසිරි මහතා
15. ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා
16. වැඩ අධිකාරි-පී.ඩී.ඩී.එස් ගුණතිලක මහතා

බලතල

- රුපියල් ලක්ෂ විස්සක් දක්වා වූ සියළුම ඇස්තමේන්තු අනුමත කිරීම.
- බල ප්‍රදේශයේ පොදු මංමාවත් සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.සම්මත කරදෙන්න

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ කාර්මික සේවා කමිටුව පත් කිරීම හා කමිටුවට බලතල පැවරීමේ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව කාර්මික සේවා කමිටුව පත්කිරීම සහ බලතල පැවරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(4) නිවාස හා ප්‍රජා සංවර්ධනය කමිටුව පත්කිරීම සහ බලතල පැවරීමේ යෝජනාව.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

1. ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් - සභාපති
2. ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා
3. ගරු මන්ත්‍රී කේ.එම් අජිත් තිලකසිරි මහතා
4. ගරු මන්ත්‍රී ආර්.එම්.උපුල් නිශාන්ත මහතා
5. ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
6. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
7. ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා
8. ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා
9. ගරු මන්ත්‍රී ඒ.පී. තරංග චමිපික අලහකෝන් මහතා
10. ගරු මන්ත්‍රිනී බී.එම්. ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
11. ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මහත්මිය
12. ගරු මන්ත්‍රිනී ආර්. එම්. නිලන්ති විජේසිංහ මහත්මිය
13. ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා
14. ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා
15. ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා
16. ප්‍රජා සංවර්ධන නිලධාරී -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
17. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - ජේ.ආර් ටේලර් මහත්මිය
18. වැඩ අධිකාරී - පී.ඩී.ඩී.එස්.ගුණතිලක මහතා

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව පත්කිරීමේ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව නිවාස හා ප්‍රජා සංවර්ධනය කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(5) සංවර්ධන උපදේශක කමිටුව පත්කිරීමේ යෝජනාව**

ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - සභාපති
2. ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
3. ගරු මන්ත්‍රිනී ආර්.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
4. ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා
5. ගරු මන්ත්‍රී කේ.එම් අජිත් තිලකසිරි මහතා
6. ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා
7. ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා
8. ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා
9. ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව - ඒ.එස්.එම් ප්‍රනාන්දු මහත්මිය
10. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - ජේ.ආර් ටේලර් මහත්මිය
11. ආදායම් ප්‍රවර්ධන නිලධාරි- ඒ.එල්.එන් අබේරත්න මහත්මිය
12. වැඩ අධිකාරී - පී.ඩී.ඩී.එස්.ගුණතිලක මහතා
13. ප්‍රජා සංවර්ධන නිලධාරී එම්.ඩබ්-.අජන්තා කුමාරි මහත්මිය
14. ගිණුම් නිලධාරී-ආර්.පී.පී.එස් ධර්මදාස මහත්මිය
15. දිග්ගලගෙදර ශ්‍රී ශෛලතලාරාමාධිපති -පූජ්‍ය වහන්තරේ සිද්ධාර්ථ හිමි
16. පූජකතුමා- කතෝලික දේවස්ථානය - හෙට්ටිපොල
17. මවුලවීතුමා - මුස්ලිම් දේවස්ථානය - හෙට්ටිපොල
18. හෙට්ටිපොල වෙළඳ සංගමයේ සභාපති
19. විශ්‍රාමික උපගුරු -ඩී.ඩබ්.එන්.සියඹලාපිටිය මහත්මිය
20. විශ්‍රාමික පුස්තකාලයාධිපති- ඩබ්.ජී.එච්.ටී.එම්.ලීලා චිත්‍රානි මහත්මිය
21. මහජන සෞඛ්‍ය පරීක්ෂක - පඩු/නැගෙනහිර ජේ.එම්.පී.ඩබ්. ජයසුන්දර මහතා
22. මහජන සෞඛ්‍ය පරීක්ෂක - පඩු/බටහිර ඩබ්.ඒ.එස් ලක්ෂ්මන්මහතා
23. ගණකාධිකාරී -සනත් උදය කුමාර මහතා

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න.

ගරු මන්ත්‍රිනී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව සංවර්ධන උපදේශක කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැඳී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(6) පුස්තකාල උපදේශක කමිටුව පත්කිරීමේ යෝජනාව.**

ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා.

1.ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා
2.ගරු මන්ත්‍රී කේ.එම්.අජිත් තිලකසිරි මහතා
3.ගරු මන්ත්‍රිනී පී.නිමල්කා කොටඹගේ මහත්මිය
4.ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා
5.ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
6.ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
7.ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
8.ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා

9.ගරු මන්ත්‍රී එම්.විරාජ් මලින්ද ඩයස් මහතා
10.ගරු මන්ත්‍රී පී.ඩී.ඩී.එස්.දොලවත්ත මහතා
11.ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව, ඒ.එස්.එම්. ප්‍රනාන්දු මහත්මිය
12.ප්‍රජා සංවර්ධන නිලධාරි, එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
13.සංවර්ධන නිලධාරි, ජගත් කුමාර මහතා
14.සංවර්ධන නිලධාරි, ශිරෝමි විජේසිංහ මහත්මිය
15.පුස්තකාලය සහායිකා, හෙට්ටිපොළ මහජන පුස්තකාලය
16.දිග්ගලගෙදර ශ්‍රී ශෛලතලාරාමාධිපති , පූජ්‍ය වහන්තරේ සිද්ධාර්ථ සිවාමීන් වහන්සේ
17.මවුලවිතුමා, මුස්ලිම් පල්ලිය, හෙට්ටිපොළ
18.මවුලවිතුමා, මුස්ලිම් පල්ලිය, බණ්ඩාරකොස්වත්ත
19.පූජකතුමා, කතෝලික දේවස්ථානය,හෙට්ටිපොළ
20.විශ්‍රාමලත් උප ගුරු, ඩී.ඩබ්.එන්.සියඹලාපිටිය මහත්මිය, කැලියාව, හෙට්ටිපොළ
21. විශ්‍රාමලත් විදුහල්පති,ජයතිලක මහතා
22. විශ්‍රාමලත් උප ගුරු එච්.එම්.සුමනා හෙට්ටිආරච්චි මහත්මිය,ගිරාතලාන
23. විශ්‍රාමලත් උධ්‍යාපන අධ්‍යක්ෂ, ඩබ්.ඒ.ජයසේන වික්‍රමසිංහ මහතා, මකුල්වැව,කුරටිහේන
24. විශ්‍රාමලත් උප ගුරු සුගත් අලහකෝන් මහතා, මූණමල්දෙණිය
25. පාඨශාලාචාර්ය,දසනායක කොටුවැල්ල මහතා
26. ග්‍රාම නිලධාරි (ලේඛන), එන්.ඩබ්.ගයාන් මාරසිංහ මහතා
යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

<u>ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)</u>
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව පුස්තකාල උපදේශක කම්ටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

## (7) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරිමේ යෝජනාව.</u>

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා.</u>

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - සභාපති
2. ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා
3. ගරු මන්ත්‍රීනී එස්.එම්. සජිනා සුරංගි මහත්මිය
4. ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
5. ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
6. ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා
7. ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව - ඒ.එස්.එම්.ප්‍රනාන්දු මහත්මිය
8. ප්‍රජා සංවර්ධන නිලධාරී -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
9. මහජන සෞඛ්‍ය පරීක්ෂක - පඩු/බටහිර ඩබ්.එම්.එස්.බී.වීරසේකර මහතා
10. මහජන සෞඛ්‍ය පරීක්ෂක - පඩු/නැගෙනහිර එස්. ප්‍රේමරත්න මහතා -
11. පරිසර නිලධාරි - පඩු/බටහිර ආර්.කේ.එස්.රාජපක්ෂ මහතා
12. පරිසර නිලධාරි - පඩු/බටහිර කේ.එස්.ඩී.එස්.සමරසිංහ මහතා
13. පරිසර නිලධාරි - පඩු/නැගෙහිර ආර්.ඩී.එන්.යූ.රන්කොත් මහත්මිය
14. වෙළඳ සංගමයේ සභාපති - විරාජ් මහතා සංවර්ධන නිලධාරී - එම්.එම්.නිමාලි මහත්මිය
15. සංවර්ධන නිලධාරී -එල්.එන්.නෝබට් මහතා
16. ගණකාධිකාරී-සනත් උදය කුමාර මහතා -වඩුමුන්න,කුරටිහේන

මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

<u>ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා- (ජා.ජ.බ)</u>
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව සන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරිමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (8) <u>ගැටුම් නිරාකරන කමිටුව පත් කිරිමේ යෝජනාව</u>

<u>**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා.**</u>

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා- (ජා.ජ.බල) - සභාපති
2. ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා
3. ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය-(ජා.ජ.බල)
4. ගරු මන්ත්‍රීනී ආර්. එම්. නිලන්ති විජේසිංහ මහත්මිය-(ස.ජ.බ)
5. ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා-(ස.ජ.බ)
6. ගරු මන්ත්‍රී ඒ.පී. තරංග වම්පික අලහකෝන් මහතා-(ශ්‍රී.ල.පො.ජ.පෙ)
7. ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා-(ස්වාධීන)
8. ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා- (ස.ල.ම.කො)
9. ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව- ඒ.එස්.එම්.ප්‍රනාන්දු මහත්මිය
10. ප්‍රජා සංවර්ධන නිලධාරී - එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
11. ප්‍රාදේශීය ලේකම් (බටහිර) - අයි.පී.එන්.පී තිලකරත්න මහතා
12. පොලිස් ස්ථානාධිපති - හෙට්ටිපොල
13. පොලිස් කාන්තා කාර්යංශයේ ස්ථානාධිපති - කාංචනා මහත්මිය
14. ප්‍රාදේශීය  නිලධාරී - ගොවිජන සේවා මධ්‍යස්ථානය නුගවැල
15. විශ්‍රාමලත්උප ගුරු- ඩී.ඩබ්.එන්.සියඹලාපිටිය මහත්මිය
16. විශ්‍රාමලත් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂිකා- දයා හෙට්ටිආරච්චි මහත්මිය
17. පූජ්‍ය රතනජෝති ස්වාමීන් වහන්සේ ,නාගිතාරාමය,හන්තිහව,හල්මිල්ලවැව
18. මවුලවිතුමා - මුස්ලිම් පල්ලිය, හෙට්ටිපොල
19. විශ්‍රාමලත් තාක්ෂණ නිලධාරී -නිමල් ජයවීර මහතා

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

<u>**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**</u>
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගැටුම් නිරාකරන කමිටුව පත් කිරිමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (9) සෞඛ්‍ය සනීපාරක්ෂක කටයුතු නැංවිම සහ මාතෘ ළමා රැකවරණ සේවා කමිටුව පත් කිරිමේ යෝජනාව.

<u>**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**</u>

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - සභාපති
2. ගරු මන්ත්‍රීනී නිමල්කා කොටඹගේ මහත්මිය
3. ගරු මන්ත්‍රීනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය

4. ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා
5. ගරු මන්ත්‍රීනී බී.එම්. ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
6. ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව- ජී.එස්.එම් ප්‍රනාන්දු මහත්මිය
7. ප්‍රජා සංවර්ධන නිලධාරී -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
8. සංවර්ධන නිලධාරී (ජල හා සනීපාරක්ෂක- එන්.එල්.නෝබට් මහතා
9. සංවර්ධන නිලධාරී (ඝන අපද්‍රව්‍ය කළමණාකරන) -එම්.එම්.නිමාලි මහත්මිය
10. දන්ත ශල්‍ය - වෛද්‍ය මාරසිංහ මහතා,හෙට්ටිපොල
11. මහජන සෞඛ්‍ය පරීක්ෂක - පඩු/නැගෙහිර එස්. ප්‍රේමරත්න මහතා
12. පරිපාලන පවුල් සෞඛ්‍ය සේවිකා හා ප්‍රධාන හෙද නිලධාරි

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

<u>ගරු මන්ත්‍රී බී. සුදත් උදය කුමාර මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව සෞඛ්‍ය සනීපාරක්ෂක කටයුතු නැංවීම සහ මාතෘ ළමා රැකවරණ සේවා කමිටුව පත් කිරිමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(10)** **ආයුර්වේද උපදේශක කමිටුව පත්කිරීමේ යෝජනාව**

<u>**සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**</u>

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා -සභාපති
2. ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
3. ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා
4. ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මහත්මිය
5. ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා
6. ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව - ජී.එස්.එම්.ප්‍රනාන්දු මහත්මිය
7. ප්‍රජා සංවර්ධන නිලධාරී -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
8. ආයුර්වේද වෛද්‍ය - පඩුවස්නුවර ප්‍රාදේශිය සභා ආයුර්වේද මධ්‍යස්ථානය
9. විෂයභාර නිලධාරී, පී.නිෂාධි දිල්රුක්ෂි මහත්මිය
10. සර්වාංග වෛද්‍ය ( ආයුර්වේද සංරක්ෂණ මණ්ඩල නියෝජිත)- බී.එම්.ගුණතිලක මහතා
11. පාරම්පරික වෛද්‍ය ලක්ෂ්මන් වික්‍රමසිංහ මහතා - (උඩගම, කුරටිහේන)
12. කැඩුම් බිඳුම් වෛද්‍ය ආර්.වී.පොඩි අප්පුහාමි මහතා - ( ගල්කන්ද වෛද්‍ය මධ්‍යස්ථානය)
13. පාරම්පරික සර්වාංග වෛද්‍ය -එම්.එම්.උපුල් ශාන්ත මහතා ( පඩුවස්නුවර වෛද්‍ය මධ්‍යස්ථානය)
14. අනුර වෙද මහතා-තෙන්ගොඩගෙදර

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ආයුර්වේද උපදේශක කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

## (11) ළමා හා කාන්තා කටයුතු කමිටුව පත්කිරීමේ යෝජනාව.

**සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

1.ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - සභාපති
2. ගරු මන්ත්‍රිනී නිමල්කා කොටඹගේ මහත්මිය
3. ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
4. ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
5. ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා
6. ලේකම්, පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව - ඒ.එස්.එම්.ප්‍රනාන්දු මහත්මිය
7.ප්‍රජා සංවර්ධන නිලධාරී -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
8. පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන නිලධාරී -ඒ.පී.ආර්.ඩී. සෝමදාස මහතා
9. මුල් ළමා විය සංවර්ධන සහකාර නිලධාරි, පඬුවස්නුවර (බටහිර)
10. මුල් ළමා විය සංවර්ධන සහකාර නිලධාරි, පඬුවස්නුවර (නැගෙනහිර),ඩී.එම්.එස්.දසනායක මහතා
11.පොලිස් කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති කාන්තා පොලිස් පරීක්ෂක
12.කාන්තා පොලිස් පරීක්ෂක,කාංචනා මහත්මිය
13. සංවර්ධන නිලධාරි,ජේ.ඒ.ජගත්කුමාර මහතා
14.මහජන සෞඛ්‍ය පරීක්ෂක හා උපදේශන නිලධාරි, පී.එම් දිනේෂ් පතිරාජ මහත්මිය
15.පෙර පාසල් පාලිකා-තක්ෂිලා පෙර පාසල- හෙට්ටිපොල.ඩී.ජී.ප්‍රියන්ති මල්ලිකා මහත්මිය
16. පෙර පාසල් පාලිකා- සිඟිති පෙර පාසල - එම්.එන්.වජිරා තෙන්නකෝන් මහත්මිය
යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ළමා හා කාන්තා කටයුතු කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

## (12) ආපදා කළමණාකරණ කමිටුව පත් කිරීමේ යෝජනාව.

**සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා- සභාපති
2. ගරු මන්ත්‍රී බී. සුදත් උදය කුමාර මහතා
3. ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා
4. ගරු මන්ත්‍රිනී බී.එම්. ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
5. ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
6. ලේකම්, පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව - ඒ.එස්.එම්.ප්‍රනාන්දු මහත්මිය
7. ප්‍රජා සංවර්ධන නිලධාරී -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
8. ආදායම් ප්‍රවර්ධන නිලධාරි- ඒ.එල් .එන්. අබේරත්න මහත්මිය
9. වැඩ අධිකාරී - පී.ඩී.ඩී.එස්.ගුණතිලක මහතා
10. සංවර්ධන නිලධාරී(ආපදා කළමනාකරණ) -ඩබ්.ඒ.සී.එස්.විජේසිංහ මහත්මිය
11. සංවර්ධන නිලධාරී(ආපදා කළමනාකරණ) පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය(බටහිර)
12. සංවර්ධන නිලධාරී(ආපදා කළමනාකරණ) පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය(නැගෙනහිර)

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

**<u>ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා- (ජා.ජ.බ)</u>**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ආපදා කළමණාකරණ කමිටුව පත් කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(13) පරිසර සංරක්ෂණ ඒකකය පත්කිරීමේ යෝජනාව**

**<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

1. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා- සභාපති
2.ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව -.එස්.එම් ප්‍රනාන්දු මහත්මිය
3.සංවර්ධන නිලධාරී(පරිසර)-ඩබ්.පී.සී.එල් පතිරණ මහතා
4. ප්‍රජා සංවර්ධන නිලධාරි -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
5.මහජන සෞඛ්‍ය පරීක්ෂක - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - පඩු/බටහිර
6.මහජන සෞඛ්‍ය පරීක්ෂක - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පඩු/නැගෙනහිර
යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

**<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පරිසර සංරක්ෂණ ඒකකය පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**<u>(14) ලංසු විවෘත කිරීමේ කමිටුව පත්කිරීමේ යෝජනාව</u>**

**<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

1. ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව -.එස්.එම් ප්‍රනාන්දු මහත්මිය - සභාපති
2. ආදායම් ප්‍රවර්ධන නිලධාරි -ඒ.එල්.එන් අබේරත්න මහත්මිය
3. ප්‍රජා සංවර්ධන නිලධාරි -එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
4. තාක්ෂණ නිලධාරි -එස්.එච්.එම්.එල්.එස්.සුගතදාස මහතා

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ලංසු විවෘත කිරීමේ කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී**

**(15) මූල්‍ය රීති 177 ට අනුව රු.5000.00 ට අඩු ගෙවීම් නිර්දේශ කිරීමේ කමිටුව පත්කිරීමේ යෝජනාව.**

**<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

1. ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව -.එස්.එම් ප්‍රනාන්දු මහත්මිය - සභාපති
2. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - ජේ.ආර්.වෙලර් මහත්මිය
3. වැඩ අධිකාරී - පී.ඩී.ඩී.එස්.ගුණතිලක මහතා

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව මූල්‍ය රීති 177 ට අනුව රු.5000.00 ට අඩු ගෙවීම් නිර්දේශ කිරීමේ කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**<u>(16) අභ්‍යන්තර විගණන කමිටුව පත්කිරීමේ යෝජනාව.</u>**
**<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

1. සංවර්ධන නිලධාරි(අභ්‍යන්තර විගණන) -ඒ.බී.කේ.කේ.රත්නායක මහත්මිය
2. සංවර්ධන නිලධාරි -බී.වයි.එස්.ඩී.කුමාරි මහත්මිය
3. සංවර්ධන නිලධාරි නිලධාරි - එම්.එස්.උදයංගනී මහත්මිය

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)</u>**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව අභ්‍යන්තර විගණන කමිටුව පත්කිරීමේ යෝජනාව රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(17)තක්සේරු කමිටුව පත්කිරිමේ යෝජනාව.**
**<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

1. ආදායම් ප්‍රවර්ධන නිලධාරි -.එල්.එන්.අබේරත්න මහත්මිය - සභාපති
2. වැඩ අධිකාරී - පී.ඩී.ඩී.එස්.ගුණතිලක මහතා
3. ආදායම් පරීක්ෂක - ඒ.එච්.එම්.එස්.පියරත්න මහතා
4. ආදායම් පරීක්ෂක - අයි.එම්.එස්.මධූභාෂිණි මහත්මිය

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

**<u>ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා- (ජා.ජ.බ)</u>**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව තක්සේරු කමිටුව පත්කිරිමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(18) තාක්ෂණ ඇගයීම් කමිටුව පත්කිරීමේ යෝජනාව.**

**<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

1. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - ජේ.ආර් ටේලර් මහත්මිය
2. ආදායම් ප්‍රවර්ධන නිලධාරි -ඒ.එල්.එන්.අබේරත්න මහත්මිය
3. ප්‍රජා සංවර්ධන නිලධාරී-එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය
4. වැඩ අධිකාරී - පී.ඩී.ඩී.එස්.ගුණතිලක මහතා
5. ගිණුම් නිලධාරි - ඊ.පී.පී.එස්.ධර්මදාස මහත්මිය

6. තාක්ෂණ නිලධාරි - එස්.එච්.එම්.එල්.එස්.සුගතදාස මහතා
7. තාක්ෂණ නිලධාරි - එම්.එල්.එම්.ෆවුදාන් මහතා
8. වාහන සම්බන්ධයෙන් වන කටයුතුවලදී පළාත් පාලන දෙපාර්තමේන්තුවනිර්දේශ කරන නිලධාරියෙකු.

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

ගරු මන්ත්‍රිනී එස්.එම්. සජිනා සුරංගි මහත්මිය- (ජා.ජ.බ)

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව තාක්ෂණ ඇගයීම් කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (19) දුක් ගැනවිලි කමිටුව පත්කිරීමේ යෝජනාව

**සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

1. ඒ.එස්.එම්.ප්‍රනාන්දු මහත්මිය ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව -සභාපති
2. ජේ.ආර්.ටේලර් මහත්මිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී -සාමාජික
3. එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය, ප්‍රජා සංවර්ධන නිලධාරී - සාමාජික
4. පී.ඩී.ඩී.එස් ගුණතිලක මහතා, වැඩ අධිකාරි - සාමාජික
5. එල්.ඒ.එන් අබේරත්න මහත්මිය,ආදායම් ප්‍රවර්ධන නිලධාරී -සාමාජික

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව දුක් ගැනවිලි කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (20).මිල ගණන් විවෘත කිරිමේ කමිටුව

**සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

1.එස්.එම්.ප්‍රනාන්දු මහත්මිය ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
2.ජේ.ආර්.ටේලර් මහත්මිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
3.එච්.එම්.ඩී.එච්.මැණිකේ -කළමනාකරණ සේවා නිලධාරී

යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

ගරු මන්ත්‍රී කේ.එම්.අජිත් තිලකසිරි මහතා - (ජා.ජ.බ)

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව මිල ගණන් විවෘත කිරිමේ කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (21).බාහිර විගණන උපදේශන කමිටුව පත් කිරීම

<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>
1.කසුන් අත්තනායක මහතා - ගණකාධිකාරි
2.ඒ.යූ.සනත් උදය කුමාර මහතා - ගණකාධිකාරි
3.බී.එම්.ජී.එච්.මාරසිංහ මහතා-දන්ත විශේෂඥ වෛද්‍ය
4.ඩී.ඩබ්.එන්.සියඹලාපිටිය මහතා - විශ්‍රාමික උපගුරු
5.ආර්.ඒ.සී.ටී.රූපසිංහ - විශ්‍රාමික පුස්තකාලයාධිපති
යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා. සම්මත කර දෙන්න

<u>ගරු මන්ත්‍රී බී.සුදත් උදය කුමාර මහතා - (ජා.ජ.බ)</u>
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව බාහිර විගණන උපදේශන කමිටුව පත්කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ)(II.) සෑම කමිටුවක් සඳහාම කාන්තා නියෝජනය 25% ක් ලෙස පත් කිරීමේ යෝජනාව (කල් තැබූ යෝජනාව)**
<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>
මා විසින් කල් තැබූ යෝජනාව ඉදිරිපත් කිරීම
ප්‍රාදේශිය සභාව මගින් පත් කරනු ලබන කමිටු සඳහා කාන්තා නියෝජනය 25% ක් ලෙස සිටිය යුතු බවට මා යෝජනා කරනවා.
<u>ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)</u>
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව සෑම කමිටුවක් සඳහාම කාන්තා නියෝජනය 25% ක් ලෙස පත් කිරීමේ යෝජනාව. ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ)III . විජය උදාගම කොට්ඨාශයේ අඹගහලන්ද අක්.70 ගම්මානයට ඇතුල්වීමට මාර්ග 5 ක් ඇති බැවින් එම මාර්ග සඳහා නාම සඳහන් නාම පුවරු සවි කිරීමේ යෝජනාව- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.කේ.එම්.එන්.විජේසිංහ මහත්මිය**
මන්ත්‍රිතුමිය සභා ගර්භයේ නොමැති නිසා මෙම යෝජනාව ඉවත් වෙනවා.

**(ඉ)IV. ප්‍රා.ස පනතේ 78(2) වගන්තිය අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් වෙත බලතල පැවරීමේ යෝජනාව**
<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>
මා විසින් ඉදිරිපත් කරනවා.

**පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සිදු කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත බලය පැවරීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තියේ විධිවිධාන යටතේ 1987 අංක 06 දරණ අතුරු සම්මත ව්‍යවස්ථා පනත් යටතේ ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සකස් කර ඇති අතුරු ව්‍යවස්ථා 42 ක් සහිත 1988.08.22 දරණ 520/7 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි

පෙ.ව.6.00 සිට ප.ව.6.00 අතර කාලය තුළ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2026 වර්ෂය සඳහා පහත නම් කරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හට පහත දක්වා ඇති රාජකාරි ඉටු කිරීමට මෙයින් බලතල පවරමි.

<u>බලය පවරනු ලබන නිලධාරීන්</u>

1. එම්.ජී.මුණසිංහ - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි,පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
2. එම්.එරංග ඉන්ද්‍රජිත් - අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි,පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
3. ජේ.ජේ.එදිරිසිංහ - අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි,පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
4. කේ.එම්.ඩී.චතුරිකා - අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි,පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය

<u>පවරනු ලබන බලතල</u>

1. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ මහජන සෞඛ්‍යය විධිවිධාන සහ සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ ක්‍රියා කිරීම.
2. අංක 21 දරණ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් අතුරු ව්‍යවස්ථා බලතල ක්‍රියාත්මක කිරීම.
3. අංක 24 දරන මැලේරියා වැලැක්වීමේ හා මදුරුවන් විනාශ කිරීමේ අතුරු ව්‍යවස්ථා බලතල ක්‍රියාත්මක කිරීම.
4. අංක 25 දරණ ස්පර්ශණ සහ ආසාධන රෝග අතුරු ව්‍යවස්ථා බලතල පැවරීම.
5. මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. අංක 32 දරණ සාතන මඩු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
7. ඩෙංගු,බරවා වැනි වසංගත නිවාරණ හා සනීපාරක්ෂක කටයුතු සඳහා දැනුවත් කිරීමේ හා පරික්ෂා කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
8. සෞඛ්‍යය අධ්‍යාපන වැඩසටහන් බල ප්‍රදේශය ආවරණය වන පරිදි කිරීම.
9. සතිපොල,වෙළඳසැල්,පොදු වෙළඳසැල් මහජන සෞඛ්‍යාරක්ෂිත බවින් යුතුව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම.
10. ඩෙංගු මදුරු කීටයන් ඉදිකිරීම් පරිශ්‍ර ආශ්‍රිතව සොයාගත් අවස්ථාවලදී අදාළ පරීක්ෂා කිරීම සඳහා යොමු වන විටදී අදාල පරිශ්‍රයේ වැඩ තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කිරීම.

<u>පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සිදු කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත බලය පැවරීම.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තියේ විධිවිධාන යටතේ 1987 අංක 06 දරණ අතුරු සම්මත ව්‍යවස්ථා පනත් යටතේ ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සකස් කර ඇති අතුරු ව්‍යවස්ථා 42 ක් සහිත 1988.08.22 දරණ 520/7 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි පෙ.ව.6.00 සිට ප.ව.6.00 අතර කාලය තුළ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2026 වර්ෂය සඳහා පහත නම් කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හට පහත දක්වා ඇති රාජකාරි ඉටු කිරීමට මෙයින් බලතල පවරමි.

බලය පවරනු ලබන නිලධාරීන්

1. එස්.එම්.කීර්ති බංඩාර - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
2. එම්.ටී.කේ.ගුණරත්න - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
3. පී.එම්.ඩී.පතිරාජ - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
4. එච්.ඒ.ඩී.ඩී.හෙට්ටිආරච්චි - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
5. ඩබ්.ඒ.එස්.ලක්ෂ්මන් - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
6. එච්.එම්.ජේ.කේ.හේරත් - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
7. එස්.ප්‍රේමරත්න - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
8. කේ.එම්.ඩී.පී.කරුණානායක - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
9. ජේ.එම්.පී.ඩබ්.ජයසුන්දර - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
10. එස්.එම්.ඒ.එස්.කේ.දුනුවිල - මහජන සෞඛ්‍ය පරීක්ෂක, පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය

පවරනු ලබන බලතල

1. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ මහජන සෞඛ්‍යය විධිවිධාන සහ සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ ක්‍රියා කිරීම.
2. අංක 21 දරණ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් අතුරු ව්‍යවස්ථා බලතල ක්‍රියාත්මක කිරීම.
3. අංක 24 දරන මැලේරියා වැලැක්වීමේ හා මදුරුවන් විනාශ කිරීමේ අතුරු ව්‍යවස්ථා බලතල ක්‍රියාත්මක කිරීම.
4. අංක 25 දරණ ස්පර්ශණ සහ ආසාධන රෝග අතුරු ව්‍යවස්ථා බලතල පැවරීම.
5. මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. අංක 32 දරණ සාතන මඩු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
7. ඩෙංගු,බරවා වැනි වසංගත නිවාරණ හා සනීපාරක්ෂක කටයුතු සඳහා දැනුවත් කිරීමේ හා පරික්ෂා කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
8. සෞඛ්‍යය අධ්‍යාපන වැඩසටහන් බල ප්‍රදේශය ආවරණය වන පරිදි කිරීම.
9. සතිපොල,වෙළඳසැල්,පොදු වෙළඳසැල් මහජන සෞඛ්‍යාරක්ෂිත බවින් යුතුව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම.
10. ඩෙංගු මදුරු කීටයන් ඉදිකිරීම් පරිශ්‍ර ආශ්‍රිතව සොයාගත් අවස්ථාවලදී අදාළ පරීක්ෂා කිරීම සඳහා යොමු වන විටදී අදාල පරිශ්‍රයේ වැඩ තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කිරීම.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් වෙත බලතල පැවරීමේ යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව ප්‍රා.ස පනතේ 78(2) වගන්තිය අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් වෙත බලතල පැවරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ)V. 2026 වර්ෂයට අදාල පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ වාර්ෂික සැලසුම් අනුමත කිරීමේ යෝජනාව සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මා විසින් ඉදිරිපත් කරනවා.

1. ආපදා කළමනාකරණය හා ගිනි ආරක්ෂණ සේවා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
2. තිරසර සංවර්ධන වැඩසටහන්/වෛද්‍යාධාර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්.උපුල් නිශාන්ත මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ වාර්ෂික සැලැස්ම සම්බන්ධ යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව 2026 වර්ෂයට අදාල පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ වාර්ෂික සැලසුම් අනුමත කිරීමේ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ)VI.පඹුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ලේ ලංකා බැංකුව විසින් බදු ලබාගෙන ඇති කඩ කාමර 2 ඉදිරි වර්ෂ 3 සඳහා නව ගිවිසුමකට එළඹීම සම්බන්ධ යෝජනාව**
**<u>සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

පඹුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ලේ පවතින කඩ කාමර වලින් ලංකා බැංකුව විසින් බදු ලබාගෙන ඇති කඩ කාමර 2 වන (G -03 හා F-03) ඉදිරි වර්ෂ 3 සඳහා නැවත ලංකා බැංකුවටම බදු ලබා දීම සුදුසුයි කියන යෝජනාව. ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යන කඩ කාර දෙකේ ගිවිසුම් කාලය 2026.03.31 දිනෙන් අවසන් වෙනවා. මේ කඩ කාමර සඳහා රජයේ තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගැනීම සඳහා 2025.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති තීරණ අංක 22 යටතේ ලබා ගත් තීරණය පරිදි 2025.08.11 දිනැති ලිපිය මඟින් තක්සේරුව ලබා දෙන ලෙස ඉල්ලා රජයේ ප්‍රධාන තක්සේරුකරුට ලිපියක් යොමු කර ඇති අතර එකී තක්සේරුව සිදු කිරීම සඳහා තක්සේරු නිලධාරින් අගෝස්තු මස පැමිණ තක්සේරුව සිදු කර ඇති බවත් එම තක්සේරුව සඳහා ගෙවිය යුතු ගාස්තුව 2025.12.16 දිනැති ලිපිය මඟින් අප වෙත එවා ඇති අතර එම ගාස්තුව 2025.12.31 දින බැංකුගත කර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව එන්.එම්.එන්. නවරත්න, ආදායම් අංශය, පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් දන්වලා තියෙනවා.ඒ අනුව පඹුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ලේ ලංකා බැංකුව විසින් බදු ලබාගෙන ඇති කඩ කාමර 2 (G -03 හා F-03) 2026.04.01 දින සිට ඉදිරි වර්ෂ 3 සඳහා බදු ලබා දීම සුදුසු බව මා විසින් යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ පඹුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ලේ ලංකා බැංකුව විසින් බදු ලබාගෙන ඇති කඩ කාමර 2 ඉදිරි වර්ෂ 3 සඳහා නව ගිවිසුමකට එළඹීම සම්බන්ධ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඹුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ලේ ලංකා බැංකුව විසින් බදු ලබාගෙන ඇති කඩ කාමර 2 ඉදිරි වර්ෂ 3 සඳහා නව ගිවිසුමකට එළඹීම සම්බන්ධ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ)VII. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අදාලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛණය මහ සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

විශේෂ යෝජනා යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අදාලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛණය මහ සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.

විශේෂයෙන්ම මේ සභාවට මම ඉදිරිපත් කරන්න ඕන ගරු මන්ත්‍රීතුමන්ලාට මේ තියෙන්නෙ 2026 සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් ලියාපදිංචි කරපු වාර්තාව.එතකොට මේකට අනුව ඉතිහාස ගත වාර්තාවක් තියලා තියනවා සැපයුම්කරුවො සේවා සපයන්නන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වෙලා තියෙනවා මේ සැරේ තරඟකාරී මිල ගණන් යටතේ අඩුම සහ හොඳම තත්වයට අපට සපයාගන්නත්, අළුත්වැඩියා කරගන්නත් හැකියාව ඒ නිසා ලැබෙනවා අපිට.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අදාලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛණය මහ සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අදාලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛණය මහ සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාවේ රැඳී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ)VIII. සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛය 01/2020 යටතේ යෝජනාව**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ජේ.ආර් ටේලර්, ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි විසින් රාජ්‍ය  මුදල් චක්‍රලේඛය 1/2020 යටතේ 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම අනුව ආයතනයේ සිදුවන සුළු මුදල් ගණුදෙනු වලදී ගෙවීම සඳහාරු.10,000.00 ක මුදල් අත්තිකාරමක් ලබා ගැනිම සඳහාත් එම මුදලින් රු.2,000.00 ක උපරිම මුදලක් වරකට ගෙවීම සඳහාත් අනුමැතිය ඉල්ලලා තියනවා.පැහැදිලි කිරීමක් කරන්න ඕනි.රු.5,000.00ට අඩු ගෙවීම් කරන්න කොහොමත් හැකියාව තියෙද්දි අයි මේක කියලා.මේ චක්‍රලේඛයට අනුව රු.25,000.00දක්වා වියදම් කිරිමේ හැකියාව තියෙනවා.චෙක් නොලියා.දැන් රු.50.00 ට 60.00 ටත් චෙක් එකක් ලියන්න වෙලා තියෙනවා.නමුත් මේක දැන් අපි සම්මත කරගත්තයින් පස්සෙ රු.2,000.00ට අඩු මුදල් චෙක් නොලියා මුදල් වශයෙන් ගෙවන්න අපිට හැකියාව ලැබෙනවා.එතකොට කාර්යක්ෂමතාවය හා චෙක්වලට යන අමතර වියදම් ටික අපිට ඉතුරු වෙනවා.යෝජනාව සම්මත කරලා දෙන්න.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ සුළු මුදල් අත්තිකාරම් සම්බන්ධව යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛය 01/2020 යටතේ යෝජනාව ගරු සභාවේ රැඳී සිටි සභිකයන් විසින්  ඒකමතිකව  සභා සම්මත කරන ලදි.**

**(ඉ)IX. ග්‍රාමීය ප්‍රදේශවල දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවල අනුකූලතා ගාස්තු අය කර ගැනීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ග්‍රාමීය ප්‍රදේශවල දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවල අනුකූලතා ගාස්තු අය කර ගැනීම සම්බන්ධ යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.ආර්.එම්.එස් රත්නායක, සංවර්ධන නිලධාරි ග්‍රාමීය ප්‍රදේශවල දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවල අනුකූලතා ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන්. ග්‍රාමීය ප්‍රදේශවල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම මෙතෙක් සිදු කර නොමැති අතර ඒ සඳහා අය කළ යුතු ගාස්තු සම්බන්ධයෙන්ද සඳහනක් නොමැති බව දන්වලා තියනවා.මේකට අනුව නාගරික ප්‍රදේශවල මේ කුළුණු සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියෙ නීතී පනවලා තියනවා.ග්‍රාමීය ප්‍රදේශවල කුළුණු මේකට ඇතුලත් කරගන්න වෙනවා.ඒ නිසා මේයෝජනාව සම්මත කර ගමු.ඔඩිට් රිපෝට් එකේ ඇවිත් තියනවා. මේවගෙන් මුදල් අයකරගෙන නෑ කියලා.අය කරලා නැති වෙන්න හේතුව තමා නීතී සම්පාදනය කරලා නැති එක ඒ හින්දා නීතී සම්මත කර ගමු ඒ නිසා මේ සඳහා යෝජනා සම්මත කරලා දෙන්න.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යොජනාවට අනුව නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශවල සම්ප්‍රේෂණ කුළුණු සඳහා අය කරන මිල ගණන්ම ග්‍රාමීය ප්‍රදේශවල සම්ප්‍රේෂණ කුළුණු සඳහාත් අය කිරීම සුදුසුයි කියලා මා විසින් යෝජනා ස්ථිර කරනවා.

**ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවල අනුකූලතා ගාස්තු අය කර ගැනීම සම්බන්ධ යෝජනාව ගරු සභාවේ රැඳී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඉ)X. ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා විසින් ගෙන ආ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රංජිත් උපාලි මන්ත්‍රිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමේ යෝජනාව**

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා ඇතුළු ගෞරවනීය මන්ත්‍රිමණ්ඩලය,ලේකම්තුමිය ඇතුළු සියළුම කාර්ය මණ්ඩලයේ සියළුදෙනාගෙන් අවසරයි.මං හිතන්නෙ අද දවස වෙනකොට මේ අවස්ථාව වෙනකොට සභාවෙ එකට වැඩ කටයුතු කරපු ජේෂ්ඨ මන්ත්‍රිවරයෙක් වන ඒ වගේම තමයි දීර්ඝ කාලයක් සභාවේ මන්ත්‍රිවරයෙක්, සභාපතිවරයෙක් විදිහට කටයුතු කරපු රංජිත් උපාලි ගරු මන්ත්‍රිතුමා රෝගාතුරව ප්‍රතිකර ලබමින් ඉන්නවා.එතුමා මම ජීවත්වන ග්‍රාම නිලධාරී වසමේ අපේ ගමේ ජීවත්වෙන්නෙ.අද වෙනකොට අපි දේශපාලන අදහස් අනුව විරෝධතාවයක් තිබ්බත් දීර්ඝ කාලීනව එතුමාගේ ජීවිතය හා දේශපාලනය පිලිබඳව බොහෝ දේවල් දන්න කෙනෙක් ඒක නිසා අද වෙනකොට වුනත් මේ සභාව පවත්වන අපිට අවශ්‍ය කරන සහයෝගය නොදුන්නත්, අපි එතුමාගේ දේශපාලන ක්‍රියාවලිය හා සමාජ ක්‍රියාවලිය පිලිබඳව අපේ හෘදසාක්ෂියට එකඟව පවත්වාගත යුතු නිසා ඒ අත්දැකීම් බොහොමයක් මාළගත් තියෙන නිසා, ඉතාමත් කණගාටුවට පත්වෙලා තියෙනවා එතුමාගේ රෝගී තත්වය පිලිබඳව.මං පෞද්ගලිකව විශාල මැදිහත්වීමක් කරලා යාළුවො, හිතවත්තු , නෑදැයො, අසල්වාසින් ඒ ගොල්ලන්ට මේ පණිවිඩය කියලා ඒගොල්ලොත් එක්කකතාබහ කරලා ඒගෙදරට එතුමාගේ බිරිඳට හා දියණියට දෙන්න පුළුවන් මානසික ශක්තිය, ධෛර්ය වගේම තවත් පහසුකම් සපයා දීම සඳහා මැදිහත් වීමක් කරා.ඒ කරේම එතුමා මේ වෙලාවෙ ගත්තොත් අවුරුදු 25 කට එහා පැත්තෙ දේශපාලන ක්‍රියාවලියක නිරත වෙලා ඉදලා අද රෝගාතුර වීම දැඩි කම්පනයකට ලක්වෙච්ච තත්වයක් බවට පත්වෙලා තියෙනවා.ඒ හින්දා අපි විශ්වාශ කරන විදිහට අපේ යම් කිසි ප්‍රාර්ථනයක් විසින් එතුමට ඉක්මන් සුවය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කිරීම සුදුසුයි. ඒ වෙනුවෙන් එතුමා බොහෝ කාලයක් හිටපු,බොහෝ කාලයක් සේවය කරපු,බොහෝ කාලයක් ඇසුරු කරපු මේ ප්‍රාදේශීය සභාවේ සභා ගර්භය ප්‍රයෝජනයට ගත යුතුය කියන යෝජනාව තමයි මං ගරු සභාපතිතුමාට ඉදිරිපත් කලේ. ඉතින් ඒකට අවස්ථාව ලබා දිම පිලිබඳව ස්තුතිවන්ත වෙමින් මේ ගරු සභාවට අපි දේශපාලනය අපිට කියා දීපු, අපි ඉගනගත්ත ඒ න්‍යායට ඒ අදහසට අනුව මම හිතනවා දොලවත්ත මන්ත්‍රිතුමත් ඒකම තමයි කියන්නෙ අපි දේශපාලනය කරන්නෙ දේශපාලන අවස්ථාවෙ පමණයි.නමුත් මේ වෙලාවෙ ගත්තොත් රංජිත් උපාලි මැතිතුමා අපි දේශපාලනය කළ යුතු අවස්ථාවක

නෙමේ ඉන්නෙ.එතුමා රෝගී වෙලා ජයවර්ධනපුර රෝහලේ දැන් ඉන්නෙ.ඉතින් එතුමා ටිකක් වයෝවෘර්දයි.වයසයි.මං හිතනවා අපේ ප්‍රාර්ථනය එතුමට ඉක්මන් සුවය ලැබෙන්න කියලා ශක්තියක් වෙයි කියලා.ඒ හින්දා මං මේ යෝජනාව මහ සභාවට ඉදිරිපත් කළා මං ප්‍රාර්ථනා කරනවා මගේ ආදරණීය මන්ත්‍රිතමාලා,මන්ත්‍රිතුමියන්ලා ඒ වගේම අපේ ලේකම්තුමිය, කාර්ය මණ්ඩලය මේ සියළුදෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා අපේ සහෝදර මන්ත්‍රීවරයෙක්, ජනතා නියෝජිතයෙක්, මුළු ජීවිතයම දේශපාලනය වෙනුවෙන් කැප කල කෙනෙක් එතුමා වෙනුවෙන් අපි හැමෝම ඉක්මන් සුවය ලැබෙන්න කියලා අපි හිතින් ප්‍රාර්ථනා කරමු. බොහොම ස්තුතියි මේ අවස්ථාව ලබා දුන්නට.

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.උප සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.ගරු සභාපතිතුමනි, ඒ වගේම ගරු මන්ත්‍රිමන්ඩලයෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලය ඒ වගේම මාධ්‍යවේදිනිය,එතුමියගෙනුත් අවසරයි.උප සභාපතිතුමා විසින් මේ අවස්ථාවේදී උචිත යෝජනාවක් තමයි ගෙනහැර දැක්වුයේ.මේ පිළිබඳව කරුණු කීපයක් කතා කිරීම සුදුසුයි කියලා හැඟී ගිය නිසා මං කැමතියි ඒ සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්න.ඇත්ත වශයෙන්ම එතුමා මේ අවස්ථාව වන විට රෝගාතුරව, ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටිනවා.ඒ වගේම මං දන්නවා විපක්ෂෙ විදිහට මන්ත්‍රිවරුන් බොහෝ සංඛ්‍යාවක් එතුමා රෝහල්ගත වීමට ප්‍රථමව එතුමාගේ නිවසට ගියා. උපසභාපතිතුමා කිව්වා වගේ ඔහුට ශක්තියක් වුනා.කරන්න පුළුවන් දේවල් වලින් ඇත්තටම අපි එතෙන්ට යනකොට සභාපතිතුමත් එදා දවල් ගිහින් ඇවිත් තිබුනා. ඔහුගේ සුවදුක් විමසීම සඳහා.දේශපාලනය තුලදී එතුමාගෙන් මා දැක්ක විශේෂ කරුණක් තියෙනවා.එතුමා තුලින් දැක්ක.මට මතක් වෙනවා එතුමා ප්‍රථම වතාවට ප්‍රාදේශීය සභාවට ඡන්දය ඉල්ලනකොට, මම දේශපාලනය නොකලත් මගේ නිවාඩු කාලසීමාවෙදි මං උදව් කලේ අපේ දයාසිරි මැතිතුමාට.දෙන්නම ප්‍රාදේශීය සභාවට ඡන්දෙ ඉල්ලුවා.අපේ හිටපු මන්ත්‍රී රාජකරුණා මැතිතුමාගේ නිවසට ගියා එදා සභාපතිධුරය කාටද දෙන්නෙ කියලා සාකච්ඡාවට.මමත් ගියා එදා. මං ගියාට මම එතුමගෙ නිවසෙදිත් මං කියලා ආවා එතුමට පක්ෂව නෙමේ කතා කලේ කියලා.නමුත් චන්ද්‍රිකා මැඩම්ගෙ තීරණය වුනේ රංජිත් උපාලි මහතා සභාපති කිරීම දයාසිරි මහතාට වඩා අඩු ඡන්ද ප්‍රමාණයක් අරන් තිබුනත් ඔහුට දිය යුතුයි කියන හැඟීමෙන් ඒක සිද්ධ වුනා.මං කථාව ඇදලා ගත්තෙ මං එතුමගෙන් ඉගනගත්තෙ රංජිත් උපාලි මැතිතුමාගෙන් ඉගන ගත්ත දෙයක් තමයි.විපක්ෂයක ඉදගෙන හෝ පක්ෂයක ඉදගෙන හෝ ආයුධ සන්නද්ධව කතා කළ යුතුයි කියන එක.ආයුධ සන්නද්ධව කියන්නෙ තුවක්කු පිහි නෙමේ.ඒ තමා විසින් යෝජනා කරන මාතෘකාවට අදාලව තමන් හොද කියවීමක් ඊට ප්‍රථමව කරලා ඒ නීතියට එරෙහිව කොහොමද ගොඩනැගෙන්නෙ කියලා ඔහු මාතෘකාවට සන්නද්ධ කරගෙන පැමිනිම.ඒක මම විපක්ෂෙ ඉදලා ඔහුත් එක්ක කටයුතු කරලා දැකපු දෙයක්.ඒ නිසා මම මගේ දේශපාලන ගමනෙදි සම්පූර්ණව ඔහුව මා වෙත ආදා ගැනීම නොකලත් මගේ හෘදසාක්ෂියයි මගේ අදහසුත් තියාගෙනම ඔහුගෙන් උකහා ගත යුත්තේ මොනවද යන්න ඒ උකහා ගැනීම කලා.ඒ උකහා ගැනීම කිසි විටෙකත් දේශපාලනය කරන කෙනෙකුට අවැඩක් වෙන්නෙ නෑ. පොදුවේ එක මධ්‍යස්ථානයක ඉදලා ඇවිල්ලා බලපුවාම ඔහු වටිනවා දේශපාලඥයෙකුට.එතකොට ඒ වගේම මමත් විපක්ෂයේ සියළු දෙනත් අපිත් මට ඇත්තටම ඒ අසනීපෙ වෙලාවෙදි කතා කරලා කිව්වා දොවවත්ත මන්ත්‍රිතුමා පුතාට කතා කරලා කොහොමද මේක කරන්නෙ කියලා බලන්න කියලා.පුතා ඉන්නෙ යාපනේ රෝහලේ. මම පුතාට ඇත්තටම කථා කරලා ඇහුවා. පුතා කිව්වා තාත්තෙ යාපනේ ඇවිල්ලා කරන්න අවශ්‍ය නැහැ. ඔහුට පුළුවන් විදිහට මං ඒ කටයුතු කරලා දෙන්නම්.එයා කොළඹ රෝහලට ගියාවෙ.මෙහෙ ආවොත් පටන් ගන්න තියෙන ඒවා මුල ඉදන් පටන් ගත්තොත් හතර පස් සැරයක් එයාට එන්න වෙනවා. ඒක කරදරයි.ඒක නිසා තාත්තා පැහැදිලි කරලා ඔහුට මේ බව කියන්න කියලා. කල යුතු මොනවද කියලා ඔහු බලලා කිව්වා. ඔහු ඇත්තටම වයෝවෘර්ධයි.එතුමාත් අවංකවම විපක්ෂයේ භූමිකාව කරනවා මිසක අවංකවම හොඳට කල්පනා කරන්න පුළුවන් හොඳ පුද්ගලයෙක් හැටියට මම දකිනවා.මේ අවස්ථාවේදි විපක්ෂයේ භූමිකාව ඔහු කරනවා. ඒකත් දේශපාලනය නිවැරදි දේශපාලනේ ඒක. අපි විපක්ෂයක ඉන්නවනම් විපක්ෂයේ භූමිකාව දැන ගත යුතුයි.භූමිකාව ඉටු කළ යුතුයි. අපි හැමෝගෙම වැරදිත් තියෙනවා. අඩුපාඩුත් තියෙනවා.ඉතින් එතුමගෙන්

මට කියන්න තියෙන්නෙත් මේ අවස්ථාවෙදි මේ යෝජනාවට අනුව මගෙත් ඇත්තටම ඔහුට අපි අදහන ආගමක් අනුව ඔහුට නිරෝගී සම්පත්තියම උදාවේවා කියලා මමත් ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මේ යෝජනාව ගෙනාවට අපේ ආණ්ඩුපක්ෂයේ උප සභාපතිතුමාට ඇත්තටම ඔහුටත් ස්තුතිකරන්න ඕන.ඇත්තටම ඔහුට ඒක ඉබේ පහල වෙලා නෙමේ හිතලා යම් යම් කරුණු එලියට ආවා.ඒ කරුණු අනුව ඔහුත් හිතලා තිබුනා.ඉතින් ඇත්තටම ඒක වෙන්න ඕන.අපි යා යුතු ගමන් මග අපි පුළුවන් තරම් අපේ ජීවිත කාලය තුලදි, අවුරුදු 100 ක් ජීවත්වෙන්නෙ නෑ.මගේ පුතා මේ පාර ගෙදර ආපු වෙලාවෙදි මට කිව්වෙ තාත්තයි අම්මයි දෙන්නා තව අවුරුදු 5 ක් 10 ක් ඉදිද කියන්න දන්නෙත් නෑ.ඒක නිසා ඔය දෙන්නා සතුටින් ඉන්න කියලා.අපි දෙන්නා රන්ඩු වෙනවා දැකලා.ඒ වගේ අපේ ජීවිතේ ඉස්සරහට තව කොච්චර කල් යයිද කියලාදන්නෙ නෑ. ඉතින් ඒක නිසා මහ පොලොවේ පය ගහලා ඉන්න ප්‍රතිරූපය මොන ආකාරයට එක එක සැරේට කටුස්සො වගේ එක එක විදිහට වෙනස් වෙනවට වඩා තමන් වෙනස් වුනාට කමක් නෑ තමන්ගෙ හෘද සාක්ෂියට එකඟව.හිත ඇතුලෙ එකක් තියාගෙන පිටින් ඒකක් තියාගෙන කටයුතු කරනවට වඩා.ඉතින් මම අර මේ කතාව ඇතුලෙන් වෙනත් මානයක් වෙත හිත ඇතුලෙ තියන දේවල් එලියට ඒම වලක්වා ගැනීම උදෙසා නැවතත් මං හැරෙන්නම් එතුමා පැත්තට අපේ ගරු හිටපු සභාපති රංජිත් උපාලි මැතිතුමා වෙත.ඉතින් එතුමාගෙන් අපිට උකහා ගතයුතු දේවල් තියෙනවා එතුමගෙන් සියල්ල නෙමේ.යම් ප්‍රමාණයක් හරි මං හිතන්නෙ 50%ට වැඩි ප්‍රතිශතයක් තියනවා කියලා හොඳ පුමාණෙත්.ඒ නිසා අවසානයටත් ඔහුටත් මං මේ යෝජනාව තුල ඉඳගෙනම ඔහුට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා ස්තුතියි.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගෞරවනීය මන්ත්‍රීමණ්ඩලයේ සියළුදෙනාගෙන්ද ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී සහෝදරතුමිය ඇතුළු සියළුදෙනාගෙන් අවසරයි.ගරු උප සභාපතිතුමා ගෙනාව යෝජනාව අනුව අපිත් එක්ක මේ සභාව ඇතුලෙ කටයුතු කරමින් අද දිනයේ හදිසි අසනීපතත්වයට පත් වෙච්ච රංජිත් උපාලි ගරු මන්ත්‍රිතුමා වෙනුවෙන් එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම වෙනුවෙන් ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් මාගේ ගෞරවනීය ප්‍රණාමය මේ මොහොතේ පුද කරනවා. හේතුව ඒ තුලින් තමයි අපිට එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමට අවස්ථාව ලැබුනෙ ඇත්තටම මීට පෙර අදහස් දක්වපු අවස්ථා දෙකේදිම එතුමා සම්බන්ධයෙන් එතුමාගේ දේශපාලන ජීවිතය සම්බන්ධයෙන් ඉතාම වටිනා දිගහැරුමක් සිදු වුනා.අපි ඇත්තටම දේශපාලන ව්‍යාපාරයක් විදිහට මම නියෝජනය කරන ජාතික ජන බලවේගය අපි හැමෝම මානවවාදී මිනිස්සු, මානව වාදී ගුණාංගයෙන් පිරුණු මිනිස්සු විදිහට අපි හැමවෙලේම උත්සාහ කරන්නෙ පුද්ගලික ප්‍රතිලාභ වරප්‍රසාද කිසිවක් අපේක්ෂා නොකරමින් මේ සමාජය සුවපත් කරන මානවවාදී සමාජයක් හැදීමේ ඒකායන පරමාර්ථයෙන් ඒ හේතුව උඩම මේ කාරණාව තුලදි මෙතුමාට රංජිත් උපාලි ගරු මන්ත්‍රිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමේ අවස්ථාව මම ඉතාම වටිනා අවස්ථාවක් කොට ගනිමින් එතුමා මේ මොහොතේ පත්ව තියෙන රෝගාතුර තත්වයෙන් මිදී ඉතාම ඉක්මනින් නැවතත් මේ දේශපාලන කටයුතුවලට සම්බන්ධ වෙමින් සභාව නියෝජනය සඳහා ඉතාම ඉක්මනින් අවස්ථාව ලැබේවා කියමින් එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන ගමන්ම එතුමා සම්බන්ධයෙන් අපි හැමෝටම තියෙන්නෙ වෙනමම දැකීමක්.මොකද එතුමා මේ දේශපාලන ගමනෙදි ප්‍රාදේශීය සභාවක් නියෝජනය කිරීමේදී ඒකට අවශ්‍ය පෙර මන්ත්‍රිතුමා සඳහන් කළා වගේ සන්නද්ධ කරුණු වලින් තමයි එතුමා අදහස් දක්වන්නෙ.එතුමාගෙන් ගත හැකි යම් ආදර්ශයන් තියනවා අපිට. ඒ නිසා එතුමාට ඉතාම ඉක්මනින් ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් නැවතත් මේ ගරු සභාවේ මන්ත්‍රීවරයාගේ භූමිකාව පණ පොවන්නට අවස්ථාව ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමින් මං නිහඬ වෙනවා.සියළුදෙනාටම ස්තුතියි.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රිතුමාලා.ඇත්තටම ගරු උප සභාපතිතුමා ගෙනාපු යෝජනාව බොහොම වටින එකක් ඒකට හේතුව රංජිත් උපාලි වර්තමාන ගරු මන්ත්‍රිතුමා වසර ගණනාවක් පඩුවස්නුවර ප්‍රාදේශිය සබාවේ සභාපති ලෙස කටයුතු කලා.මමත් මන්ත්‍රිවරයෙක් වශයෙන් එතුමාගේ සභාපතිධුරය යටතේ

කටයුතු කරලා තියෙනවා.එතුමා දේශපාලඥයෙක් වශයෙන් තමන්ගෙ යුතුකම ඉටුකරන්න උත්සාහ කරමින් හිටියා තමන්ගෙ දේශපාලන අදහස අනුව මේ වෙනකොට හෘද සැත්කම කරලා අවසන් කියලා තමයි ආරංචි තියෙන්නෙ.මම එතුමාගෙ සුවදුක් බැලීමට ගියා.බොහොම අපහසුතාවයට ලක්වෙලා තමයි හිටියෙ.මම ස්තුතිවන්ත වෙනවා බන්දුල සමරවික්‍රම අපේ උපසභාපතිතුමාට යෝජනාව ගෙන ඒම සම්බන්ධව.එතුමාගෙන් වැඩ ගන්න කණ්ඩායමටත් මතක්වෙලා තිබ්බෙ නෑ.ඒ නිසා අපිට හරි පැහැදිලියි දේශපාලන වුවමනාවන්ට පාවිච්චි කරනවා විනා හෘද සාක්ෂිය උනුවෙන හදවතක් තියෙන මිනිස්සු තමයි දේශපාලනේ අනුන් වෙනුවෙන් කටයුතු කරන්නෙ.ඒ හින්දා මම අද සතුටුවෙනවා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව වශයෙන් මේ පෙන්නපු දේ ගැන අපේ මන්ත්‍රීවරු 16 දෙනත්, විපක්ෂයෙ 5 දෙනෙක්වගේ ප්‍රමාණයක් ඔප්පු කරලා පෙන්නලා තියෙනවා හෘද සාක්ෂිය එලියට දාලා තියෙනවා.තව බොහෝ අය ඉන්න බවත් අපි දන්නවා.මේ තුන් හතර දෙනෙක්ගෙ කල්ලියකගෙ ඕනකමට තමා කටයුතු කරගෙන යන්නෙ.ඒක අද පාඩමක් ලෙස ඉගන ගත්තොත් හොඳයි ඒ අය.මෙහෙම විරුද්ධ වෙලා කටයුතු කරන්න ඕන කාලයක් ඉතිහාසෙ තිබුනා.ඒ කාලෙ අපිත් විරුද්ධ වුනා.සටන් කළා.ඒ සටන් කරේ ඒගොල්ලො කරපු ඒ ක්‍රමවේදයට විරුද්ධව.හැබැයි ඒක වෙනස් කරලා ජනතාවාදී ආණ්ඩුවක් බිහිකලාට පස්සෙ නැවත ඒ පාලනයට ගෙනියන්නනම් කටයුතු කරන්නෙ කිසිසේවත් අපි ඉඩ තියන්නෙ නෑ.මේ ස්වබාවධර්මෙ ඉඩ තියන්නෙත් නෑ.ඒ නිසා බොහොම ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම අපි ගරු රංජිත් උපාලි හිටපු සභාපතිතුමාට වර්තමාන මන්ත්‍රීතුමාට නිදුක් නිරෝගි සුවය ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම අපි සභාව මඟින් මේමොහොතෙ මුදල් කමිටුවෙන් රු.50,000.00 ක මුදලක් පරිත්‍යාග කරන්න ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරලා තියෙනවා.ඒ වගේම අනිකුත් පළාත් පාලන ආයතන වලින් උදව් උපකාර කරන්න කියලා අපි ඉල්ලීම් කරලා යවලා තියෙනවා.ඊට අමතරව අපේ මන්ත්‍රී කන්ඩායමේ මන්ත්‍රීවරු අරමුදලින් උදව්වක් කරන්නත් බලාපොරොත්තු වෙනවා.එතුමාට ඉක්මන් සුව ප්‍රාර්ථනා කරනවා වගේම බොහොම ඉක්මනින් මේ සභාවට ඇවිල්ලා ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් අපි එතුමා වෙනුවෙන් ගෙන ආ යෝජනාව නිවැසියන්ට ලබා දීමට කටයුතු කරමු.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් උපාලි මන්ත්‍රීතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සම්බන්ධ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඉ)XI. ගරු මන්ත්‍රිනී සද්නා දිල්හානි මහත්මිය ගංවතුර නිසා සෝදාපාළුවට ලක් වූ ගම්මානයට ඇති ප්‍රදානම පාර සංවර්ධනය කිරීම වෙනුවෙන් විශේෂ යෝජනාව**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

එතුමිය සභා ගර්භයේ නොමැති නිසා ඒ යෝජනාව ඉවත් වෙනවා.

**(ඉ)XII. ගරු මන්ත්‍රිනී එම් නිශාන්ති ගුණතිලක මන්ත්‍රිතුමිය සියඹලාකඩවර සිට යායේගෙදර ගම මැද පාර පිලිබඳ විශේෂ යෝජනාව**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

එතුමිය සභා ගර්භයේ නොමැති නිසා ඒ යෝජනාව ඉවත් වෙනවා.

**(ඉ)XII. ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා ගල්කන්ද වන විනාශය සම්බන්ධ විශේෂ යෝජනාව**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

එතුමා සභා ගර්භයේ නොමැති නිසා ඒ යෝජනාව ඉවත් වෙනවා.

**(ඉ)XIII. එම්.ටී.එම් තස්ලිම් මන්ත්‍රිතුමා විශේෂ ප්‍රකාශයක් කරන්න යෝජනාව**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ප්‍රකාශය ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා - (ස.ල.ම.කො)**

ගරු සභාපතිතුමා විපක්ෂයේ අය සිටිය යුතුයි මගෙ විශේෂ ප්‍රකාශය කිරීමට.

**(ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**(ඊ). I. 2025.12.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුනාසාගාර මහතා**

2025.12.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

2025.12.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති බන්දූල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

2025.12.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2025.12.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඊ). II. 2025.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුනාසාගාර මහතා**

2025.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

2025.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති බන්දූල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

2025.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2025.12.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ රැදී සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඊ). III. 2025.12.05 දින පැවති කාර්මික සේවා කමිටුවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුනාසාගාර මහතා**

2025.12.05 දින පැවති කාර්මික සේවා කමිටුවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

2025.12.05දින පැවති කාර්මික සේවා කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**</u>
2025.12.05 දින පැවති කාර්මික සේවා කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2025.12.05 දින පැවති කාර්මික සේවා කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ රැඳී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

## (ඊ). IV. 2025 නොවැම්බර් මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුනාසාගාර මහතා</u>
2025 නොවැම්බර් මස අභ්‍යන්තර විගණන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
<u>**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**</u>
2025 නොවැම්බර් මස අභ්‍යන්තර විගණන වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
<u>**ගරු උප සභාපති බන්දූල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**</u>
2025 නොවැම්බර් මස අභ්‍යන්තර විගණන වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2025 නොවැම්බර් මස අභ්‍යන්තර විගණන වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ රැඳී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

## (ඊ). V. 2025.12.24 දින පැවති සිව්වන කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුනාසාගාර මහතා</u>
2025 12.24 දින පැවති සිව්වන කාර්තුවට අදාල විගණන කමිටුවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
<u>**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**</u>
2025.12.24 දින පැවති සිව්වන කාර්තුවට අදාල විගණන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
<u>**ගරු උප සභාපති බන්දූල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**</u>
2025.12.24 දින පැවති සිව්වන කාර්තුවට අදාල විගණන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**ඒ අනුව 2025.12.24 දින පැවති සිව්වන කාර්තුවට අදාල විගණන කමිටුවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ රැඳී සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

## (උ) ලැබීම් හා වියදම් පිලිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිලිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන - නැත

**(උ). රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට -** නැත.

මම ඔබතුමාලට බොහොම ස්තුතිවන්ත වෙනවා අද දවසේ සභාවෙ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට සම්බන්ධ වීම පිලිබඳව. ඒ වගේමමේ සභාවේ සාධාරණත්වය වෙනුවෙන් හෘද සාක්ෂිය අවදි කරලා සත්‍ය වෙනුවෙන් හිටගත්ත ඒ මන්ත්‍රිතුමාලාට, මන්ත්‍රිතුමියන්ලාට අපේ ස්තුතිය පුද කරමින් අද දවසේ සභාවේ කටයුතු නිම කරනවා.සියළු දෙනාටම සුභ නව වසරක් වේවා.න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තුතිය පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පෙ.ව.1.10 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2025.01.06 දින පැවති පැවති මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ එදින පැමිනි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි